# විධිමත් රටක්

## ප්‍රතිපත්ති ප්‍රකාශණය

SCAN ME



ජාතික ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ
தேசிய ஜனநாயக முன்னணி
**NATIONAL DEMOCRATIC FRONT**

ප්‍රතිපත්ති ප්‍රකාශණය

ජනාධිපතිවරණය - 2024

# විධිමත් රටක්

ජනාධිපති නීතීඥ ආචාර්ය

**විජයදාස රාජපක්ෂ**



**මිනිසාගේ පරම යුතුකම**
**මිනිසාට සේවය කිරීමයි**
(එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක)

(Fiat justitia ruat caelum)

Let justice be done though the heavens fall

දිව්‍ය ලෝකය කඩා වැටෙද්දී වුවද යුක්තිය ඉටු කළ යුතුය

# පූර්විකාව

මීට දශක කිහිපයකට පෙර උගන සංවර්ධිත රටවල් ලෙස පැවති අප කලාපයේ බොහෝ රාජ්‍යයන් මේ වන විට සංවර්ධිත රටවල් තත්වයට දියුණු වී ඇත. යටත් විජිත සමයේ අප රට තුළ හැඩගස්වනු ලැබූ යටත් විජිත මානසිකත්වය සහ නව යටත්විජිතවාදී ප්‍රවණතා හේතුවෙන් මන්දගාමී රාජ්‍යයක් බවට පත් වූ ශ්‍රී ලංකාව මේ වන විට අතිශය දුර්වල බංකොලොත් රාජ්‍යයක් බවට පත්ව ඇත. එමෙන්ම දේශපාලන අස්ථාවරත්වය ජනතාවගේ ජන ජීවිත අසීරු තැනකට තල්ලුකොට ඇත. අකාර්යක්ෂම දේශපාලනික යාන්ත්‍රණය සහ දූෂිත දේශපාලන වළල්ල විසින් අගාධයේ පතුළට ම ඇද දමා ඇති ශ්‍රී ලංකාව මේ වන විට ගැඹුරු අර්බුදයන්ට මුහුණදී ඇත.

# ආර්ථිකය බංකොලොත් කිරීම

1977 හඳුන්වා දුන් නිදහස් වෙළඳ ප්‍රතිපත්තිය සමඟ අත්වැල් බැඳගත් ඒකාධිපති විධායක ජනාධිපති බලතල රජය සහ ජනතාව අතර පැවති සමාජ සම්මුතීන් උල්ලංඝනය කර අසත්‍ය මත පදනම් ජනප්‍රියතාවන් හුදු දේශපාලනික අරමුණු බවට පත්කරගෙන ඇත. ආකර්ෂණීය තේමා සහ සටන් පාඨ යොදා ගනිමින් තට්ටු මාරු ක්‍රමයට පවත්වා ගෙන යන දේශපාලන සංස්කෘතිය ජනතාව විසින් ප්‍රතික්ෂේප කර ඇති බව පසුගියදා දියත් වූ අරගල වලින් ප්‍රදර්ශනය විය.

නායකත්වයක් හෝ  අරමුණක් නොමැතිව පටන්ගත් ජන අරගලය විසින් දිනාගත් අයිතිවාසිකම් නැතුවාම නොවේ. රට තුළ ඇති වූ දේශපාලන අස්ථාවරභාවය හේතුවෙන් ස්ථාපිත කළ ආණ්ඩුව ලෙස මේ රටට අවශ්‍ය දේශපාලනික පරිවර්තන සඳහා මුල් අඩිතාලම ලෙස අප සමස්ත නීති රාමුව වෙනසකට පත් කරන ලදී. නීතියේ ආධිපත්‍ය බිඳ හෙළමින් අයාලේ ගිය ආර්ථිකමය ප්‍රතිපත්ති මත වංචාව, දූෂණය, හොරකම කප්පම වැනි දෑ සිංහාසනාරූඪ වූ සමාජයක් බිහිව ඇත. මානව හිතවාදී සමාජයක් බිහි කිරීම සඳහා 21 වෙනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය බෙහෙවින් ඉවහල් වේ. රාජ්‍ය සේවය දේශපාලන ග්‍රහණයෙන් මුදවාගත් කාර්යක්ෂම සේවයක් බවට පත් කිරීම සඳහා ද, යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය ස්වාධීනව සහ අපක්ෂපාතීව ඉටුකළ හැකි අධිකරණ පද්ධතියක් ද සැකසීම සඳහා ද එය මුල් වේ.



# නීතියේ ආධිපත්‍ය බිඳ වැටීම

නිදහසෙන් පසු ශ්‍රී ලංකාව තුළ රාජ්‍ය තන්ත්‍රයේ බොහෝ පරිවර්තන සිදු වූ අතර සමහර කරුණු රටේ ඉදිරි ගමනට බාධාවක් වූ බව ද පිළිගත යුතු ය. 1948 ලද ඩොමීනියන් තත්ත්වයේ නිදහසින් පසු සම්මත කළ 1972 ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් නිර්මාණය කළ බොහෝ අර්බුද අතර පහත සඳහන් අවස්ථා සමස්තයට බලපෑම් කළ හානිදායක කාරණා බව පැහැදිලිය.

- ද්වි-මණ්ඩල ව්‍යවස්ථාදායක ක්‍රමයක් යටතේ පැවති සෙනෙට් මණ්ඩලය අහෝසි කර සියලු බලතල පාර්ලිමේන්තුවට කේන්ද්‍රගත කිරීම.
- රාජ්‍ය සේවා කොමිෂන් සභාව අහෝසි කොට එහි බලතල අමාත්‍ය මණ්ඩලයට පැවරීම.
- සුලු ජාතීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා පැවති ප්‍රතිපාදනවලට සමාන ප්‍රතිපාදන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් නොකිරීම.

ඉහත හේතූන් නිසා රටේ ජාතික සමගිය බිඳ වැටීමත්, රාජ්‍ය තන්ත්‍රය දේශපාලනීකරණය වීමත් නිසා එම ආණ්ඩුව ජනතාව විසින් පරාජය කොට 1977 මැතිවරණයේ දී නව රජයක් පිහිටුවා ගන්නා ලදී. එයට ලැබුණු අසීමිත බලය යොදා ගනිමින් 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්මත කළ අතර එමගින් 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සමහර දුර්වලකම් ඉවත් කිරීමට උත්සාහයක් දරා ඇත.

සෙනෙට් සභාව අහෝසි කිරීම නිසා උගතුන්ගෙන් සහ බුද්ධිමතුන්ගෙන් ව්‍යවස්ථාදායකයට ලබා ගැනීමට තිබූ සේවය අහිමි වීමේ අඩුව පිරවීම සඳහා සමානුපාතික නියෝජන පාර්ලිමේන්තු මැතිවරණ ක්‍රමය තුළට ජාතික ලැයිස්තුවෙන් මන්ත්‍රීවරු 29 ක් ඇතුළත් කිරීමට ප්‍රතිපාදන සලසන ලදී. නමුත් ඉන් අපේක්ෂා කළ ප්‍රතිඵල නොලැබී ඇත්තේ එම අවස්ථාව හුදු ආත්මාර්ථකාමී දේශපාලන අරමුණු වෙනුවෙන් යොදා ගැනීම නිසා ය.

1972 ව්‍යවස්ථාවෙන් අහෝසි කළ රාජ්‍ය සේවා කොමිසම 1978 ව්‍යවස්ථාවෙන් නැවත ස්ථාපිත කරන ලදී. සුලු ජාතීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදනයක් නොමැති වුවත් මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයක් ඇතුළත් කරන ලදී. එහෙත් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීම සම්බන්ධව ප්‍රතිකර්ම ලබා දීම සඳහා කිසිදු අධිකරණයකට අධිකරණ බලයක් ලබා දී නොතිබුණි. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයක් ඇතුළත් කළ අතර ඒවා උල්ලංඝනය වීම සම්බන්ධයෙන් ප්‍රතිකර්ම යෙදීමට ශ්‍රේෂ්ඨාධිකරණයට අධිකරණ බලය පවරන ලදී.

1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇති කරුණු අතරින් ප්‍රබල ලෙස විවේචනයට ලක් වූ කරුණු අතර පූර්ණ මුක්තිය සහිත අසීමිත බලය ඇති විධායක ජනාධිපති තනතුර සහ වංචාවට හා දූෂණයට තෝතැන්නක් නිර්මාණය කළ සමානුපාතික නියෝජන මැතිවරණ ක්‍රමය සඳහන් කළ හැකි ය. විධායක බලයලත් ජනාධිපතිවරු දේශපාලනයේ දෙවන පෙළක් ගොඩනැගීමට ඉඩ නොදුනි. නායකත්වය සහ බලය වෙනුවෙන් කුළල් කා ගත් දේශපාලනික සංස්කෘතියක් නොවන්නට ලලිත් ඇතුළත්මුදලි, ගාමිණී දිසානායක වැනි උගත් දේශපාලන නායකයන් අදටත් ජීවතුන් අතර සිටිය යුතුව තිබුණි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මේ වන විට වරින් වර 21 වතාවක් සංශෝධනය කළත්, ජනතාව අපේක්ෂා කරන අරමුණු කරා ළං වීමට නොහැකි වී ඇත. ශ්‍රී ලංකාව දුර්වල රාජ්‍යයක් සහ බංකොළොත් රාජ්‍යයක් බවට පත් වීමට බලපෑ එකම කාරණය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පවතින දෝෂ නොවේ. නීතියේ ආධිපත්‍යයට ගරු නොකරන, සැබෑ ජනතා අභිලාෂ නොහඳුනන සහ ජනතාව වෙනුවෙන් කැප නොවුණ පාලකයින් නිසාවෙන් නිර්මාණය වූ දේශපාලන සංස්කෘතියක් විසින් ජනතාව අද සිටින දුක්ඛිත තත්ත්වයට මේ රට පත් කරන ලදී.

# ජනවාර්ගික සමගිය පලුදු වීම

රටේ ජනවාර්ගික සමගිය ආරක්ෂා කිරීමට සමත් නොවුණු නායකයින් තරුණ අසහනය සමනය කිරීමට ද අසමත් විය. 1971 තරුණ නැගිටීමේ දී 12,000 ක් ද, 88-89 භීෂණ සමයේදී 60,000 ක් ද පුරවැසියන් ඝාතනය කරන ලදී. 1983 ඇවිලුණු ජාතිවාදී යුද්ධය අවුරුදු 26 ක් පුරාවට 60,000 කට අධික පුරවැසියන් ඝාතනය කළේය. එකී ගැටුම් වලින් ආර්ථිකයට සිදු වූ පාඩුව මෙතෙකැයි ගණන් බැලිය නොහැකි අතර ආර්ථික වශයෙන් මේ රට අවුරුදු 30-40 ක කාලයකට ආපසු ඇදගෙන ගොස් ඇති බව පැහැදිලිය.

ජනතාවගේ පරමාධිපත්‍ය බලය ඩැහැ ගැනීමට පහසුම ක්‍රමය ජනතාවගේ යැපුම් මානසිකත්වය එසේම පවත්වාගෙන යෑම බව විශ්වාස කරන දේශපාලනඥයන් ඡන්දය ලබා ගැනීම සඳහා නොයෙකුත් වරදාන ප්‍රදානය කළහ. ජනසවිය, සමෘද්ධිය, දිවි නැගුම, ගම්පෙරළිය, අස්වැසුම එම ක්‍රියාන්විත විය. නිර්ධන පන්තියේ දේශපාලඥයන් බොහෝ දෙනෙක් කෙටි කලක් තුළ ධන කුවේරයන් බවට පත්ව ඇත. ජනතාවගෙන් සොරාගත් ධනස්කන්ධයෙන් සොච්චමක් මැතිවරණ වල දී වියදම් කිරීම මගින් රාජ්‍ය බලය රැකගන්නා දේශපාලනඥයින්ගේ හාල් සේරුවට, මත්පැන් බෝතලයට ජනතාවගේ පරමාධිපත්‍යය බලය දූෂිතයන්ට පාවා දීමට ජනතාව පෙළඹුනහ.

# පොරොන්දු දේශපාලනය

මැතිවරණ සමයේ ඉදිරිපත් කරන ප්‍රතිපත්ති ප්‍රකාශන සහ වැඩපිළිවෙළ චිත්තාකර්ශණීය ආටෝපයන්ගෙන් විචිත්‍රවත් වී තිබුණ ද, අවසානයේ ඔවුන් ජනතාවට උරුමකර දුන්නේ බංකොළොත් රටකි. එම බංකොළොත්භාවය කොතෙක්දැයි අවබෝධකර ගැනීම සඳහා පහත සඳහන් දත්ත ප්‍රයෝජනවත් වේ.

- 2005 නොවැම්බර් මස රුපියල් බිලියන 2,160 ක රාජ්‍ය ණය 2015 බල හුවමාරුව වන විට රුපියල් බිලියන 8,000 ක් දක්වා ද, 2019 බල හුවමාරුව වන විට රුපියල් බිලියන 13,000 දක්වා ද, 2022 අරගලය පැන නගින විට රුපියල් බිලියන 21,000 ක් ද, වර්තමානය වන විට රුපියල් බිලියන 30,000 (ඩොලර් බිලියන 100) දක්වා ද වර්ධනය වී ඇත. ඒ සා විශාල ණය කන්දරාවකින් අප රට සපුරාගත් කිසිදු සංවර්ධන ඉලක්කයක් නොමැත. එකී ඩොලර් බිලියන 100 ක ණය මුදලින් බිලියන 37 ක් විදේශ ණය ද, ඉතිරිය දේශීය ණය ද වේ.
- අපනයන ආදායම ඉක්මවා ආනයන වියදම ඉහළයාම නිසා වෙළඳ හිඟය ඇ.ඩො. බිලියන 12 ක් වී ඇත.
- රැකියා විරහිතභාවය 5% ක් වන අතර ඉන් 23% ක් තරුණ තරුණියන් ය.
- 2022 ආර්ථික වර්ධන වේගය සෘණ 7.3% ක් වූ අතර 2023 දී මෙය සෘණ 2.3% කි.
- ලෝක බැංකු වාර්තා අනුව ජනතාවගෙන් 25% ක් දිළිඳු බවේ රේඛාවෙන් පහළ ජීවත් වේ.
- ශ්‍රී ලංකාවේ ඉහළ ම ආදායම් ලබන 1%, සමස්ත ආදායමෙන් 15% ක් ද, ඉහළ ආදායම් ලබන මුල් 10% සමස්ත ආදායමෙන් 42% ක් ද බුක්ති විඳින අතර අඩුම ආදායම් ලබන අවසාන 50% බුක්ති විඳින්නේ සමස්ත ආදායමෙන් 16% ක් පමණි.

# ජාතික සම්පත් කොල්ලකෑම සහ විකුණීම

රජයන් විසින් ජාතික සම්පත් කුණු කොල්ලයට විකුණා දැමීම ආර්ථිකයට මරු පහරක් වන්නා සේ ම අනාගතයේදී එය ශ්‍රී ලංකාවේ ස්වෛරීභාවයට බරපතළ තර්ජනයක් වන බව ද නොඅනුමානය. කොළඹ වරායේ දකුණු පර්යන්තය, හම්බන්තොට වරාය වැනි දෑ විදේශ ආධිපත්‍යයන්ට පවරා දීම හරහා හූ දේශපාලනයේ හටගන්නා විෂමතා හේතුවෙන් රට බරපතළ අර්බුධකාරී තත්ත්වයකට තල්ලු වෙමින් පවතී.

ජනතාවගේ අත්‍යවශ්‍ය භාණ්ඩ සහ සේවාවන් සැපයීමට හැකි වූයේ ඉන්දියාවෙන් ලද ඩොලර් බිලියන 4 ක ණය සහ ප්‍රදානයන්ගෙනි. එමෙන් ම GSP සහනය තවත් වසර 4 ක කාලයක් සඳහා ලබා දීම නිසා ද, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහාය ද ලබා දීම නිසා ද, අද තිබෙන තත්ත්වය පවත්වා ගෙන ගිය ද, 2027 වන විට ණය සහ පොලී ගෙවීමට නියමිත බැවින් නුදුරු අනාගතයේ මහත් අභියෝගයයනට මුහුණ දීමට සිදු වේ.

# අනගත අපේක්ෂාවන්

ජාතික ආරක්ෂාව ප්‍රමුඛතම වගකීම ලෙස සලකා රාජ්‍යය තුළ සිදුවිය යුතු වෙනස්කම් සිදුකිරීම නව රජයක් පත්කිරීම මගින් ජනතාව බලාපොරොත්තු වන ප්‍රධාන ම කරුණක් වේ. ඒ අනුව අතීතයෙන් උගත් පාඩම් අනුව මෙරට සිදුවිය යුතු වෙනස පැතිකඩ ගණනාවකින් සිදුවිය යුතු බව පැහැදිලි ය.

එක්සත් ජාතීන්ගේ සංවිධානය 2015 ආරම්භ කළ 2030 ළඟාකර ගැනීමට බලාපොරොත්තු වන තිරසාර සංවර්ධන ව්‍යාපෘති ඉලක්ක සාක්ෂාත් කරගත හැකි පරිදි අපගේ ආර්ථික, සෞඛ්‍ය, අධ්‍යාපනික සංවර්ධන ඉලක්ක ජයගැනීම පිණිස අපි එක්ව කැපවී කටයුතු කරමු.

# නීතියේ ආධිපත්‍යය ආරක්ෂා කිරීම

ලෝකයේ බොහෝ සම්පත් ඇති රටවල් ඉතාමත් දුගී දුප්පත් තත්ත්වයට පත්ව ඇත්තේ එම රටවල නීතියේ ආධිපත්‍ය බිඳ වැටී ඇති නිසා ය. අප්‍රිකානු කලාපයේ බොහෝ රටවල එම තත්ත්වය පවතී. කිසිදු ස්වභාවික සම්පතක් නොමැති සමහර රටවල් ඉතා දියුණු තත්ත්වයට පත්ව ඇත්තේ නීතියේ ආධිපත්‍ය ආරක්ෂාකර ගැනීම නිසා ය. සිංගප්පූරුව ඊට හොඳ ම උදාහරණයකි. ප්‍රජාතන්ත්‍රවාදය යනු සරල බසින් කිවහොත් නීතියේ ආධිපත්‍ය පවත්වා ගෙන යාමයි. නීතියට උඩින් කිසිවකු සිටිය නොහැකි අතර නීතියට යටින් ද කිසිවකු සිටිය යුතු නොවේ. එමෙන්ම විවිධත්වය තුළින් ඇතිවන ඒකමතිකභාවය (unity within diversity) ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික ම ගුණාංගය වේ. ඒ සඳහා අවශ්‍ය මුඛ්‍ය නීතිය හෙවත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිසංස්කරණ බොහොමයක් 21 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් සිදුකරන ලදී. එමෙන් ම දූෂණ විරෝධී පනත, මැතිවරණ වියදම් නියාමන පනත, තොරතුරු දැනගැනීමේ පනත, වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කර ගැනීමේ පනත යනාදී ඉතා වැදගත් පනත් සම්මත කරගත් නමුත් තවත් ප්‍රතිසංස්කරණයන්ගේ අවශ්‍යතාව අවබෝධ කරගත යුතු ය.

## අ) ජාතික සමඟිය සහ සංහිඳියාව

රටක නීතියේ ආධිපත්‍ය පවත්වාගෙන යාම සඳහා ජාතික සමඟිය සහ ප්‍රතිසන්ධානය අත්‍යවශ්‍ය කරුණකි. බහු වාර්ගික, බහු ආගමික, බහු භාෂිත සමාජයක් වන ශ්‍රී ලංකාව තුළ සහෝදරයත්වය සහ මිත්‍රශීලීභාවය සමාජයේ සෑම තැන ම පැවතිය යුතුය. ඒ සඳහා ජාති ආගම් කුලමල භේදයකින් තොරව රටේ සියලු දෙනාම ශ්‍රී ලාංකේය අනන්‍යතාවකින් යුතුව කටයුතු කිරීමට අධිෂ්ඨාන කරගත යුතුව ඇත. අතීතයේ සිදු වූ අවාසනාවන්ත සිදුවීම්වලින් උගත් පාඩම් මත අනාගතයේ දී කිසිදු ජනවාර්ගික ගැටීමක් ඇතිවීම වළක්වා ගැනීම අපගේ යුතුකමයි. අපගේ පරම්පරාව එවැනි ගැටුම්වලට මැදිහත් වී හෙම්බත් වී සිටින පරපුරක් නිසා අපගේ දරුවන්ට එවැනි අවාසනාවන්ත ඉරණමක් උරුම නොකිරීම අපගේ වගකීමයි. සුරක්ෂිත දේශයක සාමයෙන් සහ සතුටින් ජීවත් වීම සඳහා අවශ්‍ය පරිසරය නිර්මාණය කිරීම දේශපාලන නායකයින්ගේ වගකීම සහ යුතුකම වුවත් මෙතෙක් කල් සිදු වූයේ දේශපාලනඥයා විසින් තමාගේ පැවැත්ම සහ ලාභය පිණිස රටේ ජනතාව භේද-භින්න කොට ගැටුම් නිර්මාණය කිරීමයි.

අධිකරණ අමාත්‍යංශය විසින් සම්මත කරගන්නා ලද 2024 අංක 01 දරන ජාතික සමගිය සහ ප්‍රතිසංධානය පිළිබඳ කාර්යාලය ග්‍රාම රාජ්‍ය සංකල්පය මත පදනම් ව ගොඩනගා ඇති අතර සෑම ග්‍රාමසේවක වසමකම සංහිඳියා සමාජයක් ස්ථාපනය කරනු ලැබේ. මේ වනවිටත් ගම් 11,000 ක පමණ එම කටයුතු ආරම්භ කර ඇති අතර ඉදිරියේ දී රටපුරා එය ව්‍යාප්ත කිරීම මගින් ගමේ සමඟිය ආරක්ෂා කිරීමට පදනම වැටෙනු ඇත. මීට පෙර නායකයින් උඩ සිට පහළට සාමය සමඟිය ස්ථාපනයට කටයුතු කළත් එය අසාර්ථක වූයේ එම දේශපාලනඥයන්ට එවැනි අවංක කැමැත්තක් සහ චේතනාවක් නොමැති නිසා ය. එය බිම් මට්ටමේ සිට ඉහළට ගෙන යාම සඳහා අවශ්‍ය නීති රාමු සහ වැඩපිළිවෙළ මේ වනවිට සකසා ඇති අතර සෑම ගමකම ආගමික නායකයින්ට සහ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට ගම පිළිබඳ තීරණ ගැනීමේ බලය පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථා මගින් ම ලබා දී ඇත. ඒ අනුව සාමකාමී යහපත් සමාජයක් ශ්‍රී ලංකාව තුළ නිර්මාණය කර ගැනීමට සිහින දකින සැමටම මෙය සුභ ආරංචියක් වනු ඇත. ජනවාර්ගික ගැටලු ඇතිවීම වැළැක්වීමට සියලු ආගමික පූජ්‍ය-පූජක උතුමන්ලාගෙන් සමන්විත උපදේශක කමිටුවක් පත් කරන අතර පාලකයන් එම උපදෙස් අනුව කටයුතු කිරීමට පොලඹවනු ඇත.

## ආ) නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක්

සියලු ජන කොටස් සමග සාකච්ඡා කොට සහභාගීත්ව ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම අනුගමනය කරමින් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්මත කර ගැනීමට බලාපොරොත්තු වන එය ජනමතවිචාරණයකින් තොරව සිදු නොකරණු ඇත. ජනාධිපතිවරයෙකු එම ධූරය හොබවා විශ්‍රාම ගිය පසු මංත්‍රීධූර දැරීම ඇතුළු කිසිදු වැටුපක් හෝ දීමනාවක් ලබන රාජ්‍ය අංශයේ තනතුරක් දැරීම සපුරා තහනම් වේ. ජනාධිපතිවරයෙකුගේ ධූර කාලය යම් හෙයකින් නියමිත දිනට පෙර හිස් වුවහොත් අග්‍රාමාත්‍යවරයා නීතියේ ක්‍රියාකාරිත්වයෙන්

අනුප්‍රාප්තික ජනාධිපතිවරයා බවට පත්වන අතර ඉන් පසුව තුන් මාසයක් ඉක්මවීමට පෙර ජනතාවට නව ජනාධිපතිවරයෙකු තෝරා පත් කර ගැනීම සඳහා ජනාධිපතිවරණයක් පැවැත්වීම අනිවාර්ය කරමින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කෙටි කලක් තුල සංශෝධනය කරණු ලැබේ.

## ඇ) සෙනෙට් මණ්ඩලය


සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පැවති ද්වි-මණ්ඩල ව්‍යවස්ථාදායක ක්‍රමය යටතේ පාර්ලිමේන්තුව සහ උත්තරීතර මණ්ඩලය ලෙස සෙනෙට් සභාව පැවතුනි. ලෝකයේ බොහෝ රටවල මෙම ක්‍රමය පවතින්නේ පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලබන අණපනත් සම්බන්ධව ඉහළ බුද්ධි මණ්ඩලයක අධීක්ෂණය අවශ්‍ය නිසා ය. එමෙන් ම සංඛ්‍යාත්මකව සුළු ජන කොටස් ලෙස සලකන සියලු ජන කොටස්වලට සාධාරණ නියෝජනයක් එහි පවතී. ජනතාවගේ ඉහළ විශ්වාසයට සහ ගෞරවාදරයට පත් වූ තැනැත්තන් එහි සාමාජිකයන් ලෙස පත්වීම නිසා ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රශස්ත මට්ටමකට ගෙන ආ හැකි ය. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සෙනෙට් සභාව අහෝසි නොකළා නම් පළාත් සභා ක්‍රමයක් හඳුන්වා දීමේ අවශ්‍යතාවක් පැන නොනගින්නට ඉඩ තිබුණි. ජාතික සමඟිය සහ ප්‍රතිසංධානය සඳහා සෙනෙට් සභාවට මාර්ගෝපදේශකයෙක් ලෙස ද කටයුතු කළ හැකිය.

## ඈ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අර්ථ නිරූපණ පිළිබඳ නිරන්තරයෙන් මතුවන අර්බුද කෙටි කලක් තුළ විසඳා ගැනීමටත්, අධිකරණ පද්ධතිය පිළිබඳ ජනතාවට ඇති විශ්වාසය ඉහළ මට්ටමකට ගෙන යාමටත් මෙය අත්‍යවශ්‍ය වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අර්ථ නිරූපණයන්ගේ අවශ්‍යතාවයක් මතුවන විට දී ඒවා මෙම අධිකරණයට යොමු කිරීමට ද, ව්‍යවස්ථාදායකයට ඉදිරිපත් කරනු ලබන පනත් කෙටුම්පත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල ද යන්න සලකා බැලීමට ද, ජනාධිපතිවරණ මැතිවරණ පෙත්සම් විභාග කිරීමට ද, මෙම අධිකරණයට අධිකරණ බලය ලබා දිය යුතු වේ.

## ඉ) මැතිවරණ ක්‍රම සංශෝධනය

පවතින සමානුපාතික මැතිවරණ ක්‍රමය සංශෝධනයට ලක්කළ යුතුය. සෑම මැතිවරණ කොට්ඨාසයකට ම සෘජු ලෙස වගකියන මන්ත්‍රීවරයකු පත්කර ගැනීමේ අවශ්‍යතාව නිරන්තරයෙන් ජනතාව අවධාරණය කරන කරුණකි. එම ක්‍රමය සියලුම ජන කොටස්වලට උපරිම සාධාරණය ඉටුවන ආකාරයේ එකක් විය යුතු අතර බහු ආසන ක්‍රමය ද ඊට ඇතුළත් කළ හැකිය.



වංචා දූෂණ වැළැක්වීම සඳහා අලුතෙන් සම්මත කළ දූෂණ විරෝධී පනත සහ මැතිවරණ වියදම් නියාමන පනත මුලුමනින් ම බලගැන්වීම සඳහා සුදුසු යාන්ත්‍රණයක් නිර්මාණය කළ යුතු වේ. දැනටමත් කෙටුම්පත් කොට අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇති නීති විරෝධී ලෙස උපයන ලද දේපළ රාජ සන්තක කිරීමට අදාළ නීතිය සම්මිත කර ගැනීම ද අත්‍යවශ්‍ය වේ. දූෂිතයින්ගේ සහ ජාවාරම්කරුවන්ගේ මුදල් මතින් පාර්ලිමේන්තුව ඇතුලු මහජන නියෝජිත ආයතනවලට මන්ත්‍රීවරු පත් කිරීම වළකා රටට සේවය කළ හැකි අවංක සහ අව්‍යාජ බුද්ධිමතුන් සහ තරුණ තරුණියන් මන්ත්‍රීවරු ලෙස පත්කර ගැනීමට බෙහෙවින් ඉවහල් වන මැතිවරණ වියදම් නියාමන පනත පූර්ණ වශයෙන් බලගැන්විය යුතු ය.

## ඊ) මානව අයිතිවාසිකම්

කිසිදු ජාති ආගම්, භාෂා, කුල මල භේදයකින් තොරව සියලු පුරවැසියන්ට ගෞරවනීය ලෙස ජීවත්වීමට අවශ්‍ය සමාජ ක්‍රමයක් නිර්මාණය කිරීමට අප අරමුණු කරගෙන ඇත. ඉතා වේගයෙන් වැඩිවන වැඩිහිටි ජනගහනයේ සුභ සිද්ධිය වෙනුවෙන් සුභ සාධන වැඩපිළිවෙළක් හඳුන්වා දීම, දැනටමත් කෙටුම්පත් කර ඇති ආබාධිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත යෝග්‍ය පරිදි සංශෝධනය කර සම්මත කිරීම, කාන්තාවන් සහ ළමුන් ආරක්ෂා කිරීමට අදාළව නීති ප්‍රතිපත්ති සහ ක්‍රමවේද හඳුන්වා දීම, මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ තැනැත්තන් විද්‍යාත්මක ක්‍රමවේද හරහා

පුනරුත්ථාපනය කොට සමාජගත කිරීම, සිරකරුවන්ගේ අයිතිවාසිකම් සහ සුභ සාධනය තහවුරු කිරීම ද මෙම වැඩපිළිවෙළට ඇතුළත් වේ. එක්සත් ජාතීනගේ ප්‍රඥප්තීනට අනුකූලව ආදිවාසී ජනතාගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සදහා දැනටමත් කෙටුම්පත් කර ඇති පනතද සම්මත කර ගැනීමට පියවර ගනු ලැබේ.

## උ) රණවිරු සුභ සාධනය

දීර්ග කාලයක් තිස්සේ රටේ පැවති බෙදුම්වාදී යුද්ධය වෙනුවෙන් දිවිකැපකළ හමුදාවේ හා පොලීසියේ රණවිරුවන්ගේ පවුල් සුරක්ෂිතභාවය මෙන් ම ආබාධිත හේතුවෙන් විශ්‍රාම ගත් හෝ ඉවත් ව ගිය සමාජිකයන්ගේ ගැටළු නිරාකරණය කොට විසඳීම සඳහා රණවිරු සේවා අධිකාරිය පූර්ණ ප්‍රතිසංශෝධනකට ලක් කරණු ලැබේ. එම අධිකාරිය මගින් රණවිරු සුභ සාධනය සඳහා ස්වාධීන ලෙස කටයුතු කිරීමට හා ඔවුන්ගේ ප්‍රශ්ණාවලට විසඳුම් ලබා දීමට බලාපොරොත්තු වෙමි. නව ව්‍යවසායකත්ව ක්‍රමවේද හරහා ඔවුන්ගේ ආර්ථික ශක්තිය නගා සිටුවීමට පියවර ගනු ලැබේ.

## ඌ) අධ්‍යාත්මික ගුණ වගාව

සියළු දෙනාටම තමන් විශ්වාස කරණ ආගමක් හෝ ලබ්ධියක් ඇදහීමට සහ ප්‍රගුණ කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති අයිතිය සුරකීමත්, අන්තර් ආගමික සහජීවනය ප්‍රවර්ධනය කිරීමත්, ඒ සඳහා රජයෙන් ලබා දිය හැකි උපරිම මග පෙන්වීම් සහ දායකවීම තහවුරු කිරීමත් කෙරෙහි ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

අධ්‍යාත්මික වශයෙන් දියුණු මනසක් ඇති පුරවැසියන් ලෙස ජීවත් වීමට හැකි වාතාවරණයක් රටතුළ ක්‍රියාත්මක කිරීම මඟින් දැහැමි සමාජයක් නිර්මාණය කිරීමේ උත්කෘෂ්ඨ බලාපොරොත්තු අප සතුය. මතභේද පසෙකලා ආගමික සහජීවනය වර්ධනය කිරීමත්, මානසික ඒකාග්‍රතාවය දියුණු කිරීමත්, විනය ගරුක සමාජයක් නිර්මාණය කිරීමත් කාලීන අවශ්‍යතාවයක් වන අතර භාවනානුකූල ක්‍රම ජනතාව අතර ප්‍රචලිත කිරීම සඳහා සුදුසු වැඩපිළිවෙලක අවශ්‍යතාවය ඇත.

ආගමික සිද්ධස්ථාන සංරක්ෂණය සහ සංවර්ධනය වෙනුවෙන් නව වැඩසටහනක් ආරම්භ කරණු ලැබේ. බෞද්ධ විහාර සහ දේවාල ගම් සදහා වර්ථමානයේ පවතිණ නීති යාවත්කාලීන කිරීම සහ ඒ සම්බන්ධව ඇතිවන ආරවුල් නිරවුල් කිරීම සදහා විශේෂිත වූ අධිකරණයක් අරබණු ඇත.

ජනතාව අධ්‍යාත්මිකව සහ සෞඛ්‍යමය ලෙස දැනුවත් කරමින් මත්පැන් භාවිතය සහ දුම්වැටි භාවිතය අවම කර ගැනීම පිණිස කෙටිකාලීන සහ දිගු කාලීන වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ.

## එ) මාර්ග විනය

මහා මාර්ග පරිහරණය කිරීමේ දී විනයක් නොමැතිකම නිසා වාර්ෂිකව 3,000 ක් පමණ මිය යන අතර 50,000 ක් පමණ තුවාල ලබයි. වර්තමානයේ පවතින මෝටර් රථ ප්‍රවාහන නීති යාවත්කාලීන කිරීමත්, මාර්ගයේ විනය උල්ලංඝනය කරන්නන් සම්බන්ධව දැඩි නීති ප්‍රතිපත්ති හඳුන්වා දීමත්, මාර්ග නීති උල්ලංඝනය කිරීම පිළිබඳ දැඩි නිරීක්ෂණයකින් යුතුව කටයුතු කරන ආයතන ස්ථාපිත කිරීමත් බලාපොරොත්තු වේ. මාර්ග විනය නොතකන්නන් සමාජයේ වෙනත් ස්ථාන වල දී ද බොහෝ සෙයින් හැසිරෙනු ලබන්නේ යුක්තිගරුක පුරවැසියන් වශයෙන් නොවේ.

විශ්‍රාමික ජනාධිපතිවරු, ඇමතිවරු, මන්ත්‍රීවරු, නිලධාරීන්, රජයේ ආයතන සඳහා අනවශ්‍ය ලෙස වෙන් කෙරෙන මුදල් සීමා කිරීමට පියවර ගනු ලැබේ.

මත්ද්‍රව්‍ය සහ සංවිධානාත්මක අපරාධ මැඩලීමේ විශේෂ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කරනු ඇත.



# කෘෂිකර්මාන්තය

## අ) කෘෂිකර්මාන්තය සහ ගොවියා ආරක්ෂා කිරීම

ශ්‍රී ලංකාවේ ආර්ථිකය අද පවතින අවිනිශ්චිතභාවය සහ බැරෑරුම් තත්ත්වය ඉහතින් සඳහන් කරන්නට යෙදුනු අතර එම අවදානමෙන් මිදී ශක්තිමත් ආර්ථිකයක් නිර්මාණය කරමින් සංවර්ධිත රටක් සඳහා අවශ්‍ය වැඩපිළිවෙළ අප අවබෝධ කරගෙන ඇත. ශ්‍රී ලංකාවේ පවතින ස්වභාවික සම්පත් ලොව අන් කිසිදු රටක දක්නට නොලැබෙන තරම් ය. 1970 දශකයේ කෘෂිකර්මාන්තය අතින් ශ්‍රී ලංකාව පැවතියේ ඉතා ඉහළ මට්ටමක නමුත් 1977 නිදහස් වෙළඳ ප්‍රතිපත්තිය හඳුන්වා දීමෙන් පසුව එය ක්‍රමානුකූල ව බරපතළ ලෙස පසුබැස්මකට ලක්ව ඇත. දළ දේශීය නිෂ්පාදනයට කෘෂි ක්ෂේත්‍රයෙන් ලැබෙන දායකත්වය 8% ක් දක්වා පහත බැස තිබීම ඉතා අහිතකර තත්ත්වයකි. අසල්වැසි ඉන්දියාවේ එම ප්‍රතිශතය 18% ක පවතී. ක්‍රමානුකූලව වසරකට 1% බැගින් වැඩිකර ගනිමින් එම ප්‍රතිශතය 18% දක්වා වර්ධනය කර ගැනීමට සැලසුම් සකස් කරනු ඇත. දළ දේශීය නිෂ්පාදනයෙන් වැඩි කොටසක් එනම් 60% ක් පවතිනුයේ සේවා අංශය මතය. සේවා අංශය පුළුල් වෙමින් කෘෂිකර්ම සහ කර්මාන්ත අංශ හැකිලීම නිසා ආර්ථිකයේ සිදුවන සුළු විචල්‍යතාවක් නිසා වුව ද ආර්ථිකය දෙදරා යාමට ඉඩ ඇත. එහෙත් සේවා අංශය හැකිළෙමින් කෘෂිකර්ම සහ කර්මාන්ත අංශ පුළුල් කරනු ලැබුවහොත් එවැනි ආර්ථික හැලහැප්පීම් මධ්‍යයේ වුව ද රටේ ආර්ථිකයට ප්‍රබල ලෙස බලපෑමක් සිදු නොවේ. කෘෂිකර්මාන්තයට සුදුසු වගා බිම් මේ වන විට විශාල ප්‍රමාණයක් අතහැර දමා ඇති අතර සමහර වගා බිම් ගතානුගතික ක්‍රමවේදයන්ට අනුව වගා කිරීම නිසා ලබාගත හැකි අස්වැන්න පහළ මට්ටමක පවතී. විද්‍යාත්මක ක්‍රම ඔස්සේ සහ තාක්ෂණික ක්‍රම මගින් එම අස්වැන්න ඉතා ඉහළ මට්ටමකට ගෙන යා හැකි ය.

වර්තමානයේ වගාවන් සඳහා යොදනු ලබන රසායනික පොහොර අවභාවිතය අවම කොට කාබනික පොහොර යම් ප්‍රතිශතයකට ක්‍රමානුකූලව හඳුන්වා දීමට බලාපොරොත්තු වන අතර කාබනික පොහොර නිෂ්පාදනය කර ගැනීම සඳහා ගොවීන්ට අවශ්‍ය මූල්‍ය පහසුකම් සහ තාක්ෂණය සැපයීම වඩාත් යෝග්‍ය වේ. ආහාර සුරක්ෂිතතාව රටක ජීවනාලිය බඳු වන හෙයින් වස විස වලින් තොර ආහාර රටාවක් ප්‍රචලිත කිරීමටත්, ආහාරවල පවතින අයෝග්‍ය තත්ත්ව හේතුවෙන් ඇතිවන ලෙඩ රෝග ඇතිවීම් අවම කර ගැනීමටත් පියවර ගත යුතුව ඇත. ඒ සඳහා ගොවි ජනතාව දැනුවත් කිරීම ද අවශ්‍ය වේ.

වර්තමානයේ ගොවියා මුහුණ දී ඇති ඉතා බරපතළ ප්‍රශ්නය වන්නේ ඔවුන්ගේ නිෂ්පාදන වලට සාධාරණ මිල වෙළඳපොළක් නොමැතිකම ය. පෙර පැවති වී අලෙවි මණ්ඩලය, අලෙවි සංවර්ධන දෙපාර්තමේන්තුව, ස.තො.ස යනාදිය වැසී ගොස් ඇති හෙයින් ගොවියා වෙළඳ මාෆියාවේ වින්දිතයකු බවට පත්ව ඇත. කෘෂි නිෂ්පාදන සඳහා රටට අවශ්‍ය ශීතාගාර ඉදිකිරීම සහ ප්‍රවාහනය පහසු ලෙස සිදු කිරීම සඳහා වැඩපිළිවෙළක් හඳුන්වා දෙනු ලබන අතර ගම් මට්ටමෙන් සංවිධානය වී නිෂ්පාදන ඉහළ මිලකට විකිණිය හැකි වෙළඳපොළක් සොයා ගැනීම සිදුකළ යුතු ය. නිරන්තරයෙන් ම කිසිදු විමර්ශනයකින් තොරව ශ්‍රී ලංකාවේ

වැවෙන බෝග වර්ග අස්වනු ලැබෙන කාලයේ දී ශ්‍රී ලංකාවට ආනයන කිරීමේ හේතුව නිසා ගොවියාට සිදුවන හානිය අවම කර ගැනීම පිණිස ඒවා ආනයන කිරීමේ නව ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතුව ඇත.

දැනටමත් ආරම්භ කර ඇති ජාතික සමගිය සහ ප්‍රතිසංධානය කාර්යාලය යටතේ සෑම ග්‍රාමසේවක වසමක් තුළ ම ක්‍රියාත්මක වන සංහිඳියා සමාජ හරහා ඒ පිළිබඳව මඟපෙන්වීමක් සිදුකළහැකි වේ.

කෘෂිකර්මාන්තය/ධීවර කර්මාන්තය සඳහා නිරන්තරයෙන් update වන smart database/app එකක් සැදීමෙන් ගොවීන්ට ඔවුන් වගා කළ යුතු බෝග පිළිබඳ පූර්ව අවබෝධයක් ලබා දීමෙන් අතිරික්ත බෝග නාස්ති වීම අවම කර ගැනීමට පියවර ගනු ලැබේ.

## ආ) වතු ආර්ථිකය

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා නීතිය යටතේ රජයට පවරාගත් ඉඩම් වලින් වැඩි ප්‍රමාණයක් මේ වන විට පවතින්නේ කිසිදු වගාවකින් තොරව ය. ජනවසම, රාජ්‍ය වැවිලි සංවර්ධන මණ්ඩලය යන ආයතන සතු බොහෝ වතු බදු දී ඇතත් එම බදුකරුවන් ඉතා මන්දගාමී ලෙස ඒවායේ කටයුතු පවත්වා ගෙන යයි. එම වතු සංවර්ධනය සඳහා කෙටි කාලීන ඉලක්ක ලබා දිය යුතු අතර ඒවා ඉටුකළ නොහැකි නම් සංවර්ධනය කිරීම සඳහා ශක්තිය ඇති තැනැත්තන් වෙත භාර කිරීමට සිදු වේ. වගා කටයුතු සඳහා ලබාගත් රජයේ ඉඩම් විශාල ප්‍රමාණයක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන කොටුකරගෙන තබාගෙන ඇතත් ඒවායෙන් ආර්ථිකයට කිසිදු ප්‍රතිලාභයක් නොලැබේ. එම ඉඩම් පිළිබඳ ව නිසි අධ්‍යයනයකින් පසු සංවර්ධනය කිරීම සඳහා සුදුසු ක්‍රමවේදයක් හඳුන්වා දෙනු ලබන අතර වගාකළ හැකි සෑම ඉඩමක් ම වගා කිරීම පිණිස යොදාගත යුතු වේ. වගාකර නොමැති පෞද්ගලික ඉඩම් හිමිකරුගේ අයිතියට අගතියක් නොවන ලෙස වගා කිරීමට හැකියාව ඇති තැනැත්තන් මගින් වගා කිරීමට වැඩපිළිවෙළක් හඳුන්වා දෙනු ඇත.

එමෙන් ම වතුවල සේවය කරන ජනතාවගේ අවශ්‍යතාවන් සොයා බැලීම, ඔවුන්ගේ ජීවන මට්ටම ඉහළට ගෙන යාම, අධ්‍යාපනය සඳහා පහසුකම් ලබා දීම ප්‍රමුඛතාවන් ලෙස හඳුනාගෙන ඇති අතර ඔවුන්ට දැවෙන ප්‍රශ්නයක් බවට පත්ව ඇති නිවාස ප්‍රශ්නය විසඳීම වෙනුවෙන් විශේෂ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරනු ඇත.

අප රටේ කන්න ක්‍රමය අනුව වගා කටයුතු සිදු කිරීම මගින් බොහෝ කාලයක් එම ඉඩම් වලින් ප්‍රයෝජනයක් ලබා නොගෙන පවතින තත්ත්වයක් පැන නැගී ඇත. ඒ සඳහා කෙටි කාලීන අතුරු බෝග වගා කිරීම සඳහා දිරිගැන්වීම් සිදු කිරීමට බලාපොරොත්තු වේ.

කෘෂිකර්මාන්තය නංවාලීම සඳහා කෙටි කාලීන සහ දිගුකාලීන ක්‍රමෝපාය දියත් කිරීමට බලාපොරොත්තු වන අතර ගොවි ජනතාවගෙන් යම් ප්‍රතිශතයක් සෑම වසරක දී ම ක්‍රමානුකූලව මධ්‍යම පාන්තිකයන්ගේ තත්ත්වයට උසස් කිරීම තුළින් කෘෂිකර්මාන්තයේ සැබෑ වර්ධනයක් පෙන්නුම් කළ හැකිය.

ගොවි විශ්‍රාම වැටුප් සඳහා ජාතික ප්‍රතිපත්තියක් හඳුන්වා දීමට කටයුතු කරන අතර කෘෂි බෝග රක්ෂණය සඳහා දීප ව්‍යාප්ත ක්‍රමවේදයක් හඳුන්වා දීමට බලාපොරොත්තු වේ.

සත්ත්ව පාලනය දිරි ගැන්වීම මගින් රටට අවශ්‍ය කිරි නිෂ්පාදනය වැඩිකර ගැනීමටත්, බිත්තර ඇතුලු මාංශ වර්ග නිෂ්පාදනය වැඩිකර ගැනීමටත් බලාපොරොත්තු වේ.

එළවළු සහ පළතුරු මෙන් ම ගම්මිරිස්, කුරුඳු, කරදමුංගු, කහ, ඉඟුරු, මුං, මෑ, තල, උඳු, ඉරිඟු සහ මිරිස් වැනි බෝග ගෙවතු වගා ක්‍රමයට ප්‍රචලිත කිරීමටත්, ඒ සඳහා සුදුසු දිරිගැන්වීම් කිරීමටත් බලාපොරොත්තු වන අතර ඒ සඳහා නූතන තාක්ෂණය යොදා ගැනීම ඵලදායී වනු ඇත.

## ඇ) වගා හානි සහ අලි මිනිස් ගැටුම

අලි ඇතුන් ඇතුළු වනගත සත්ත්වයින් ද අපේ රටට ලැබී ඇති සම්පත්ය. එහෙත් වර්තමානයේ වගාබිම් පාළු කිරීම නිසා මරා දැමීම සහ දුම්රිය සහ වාහන වල හැපීම නිසා විශාල වශයෙන් අලි ඇතුන් ඝාතනය වීම සිදු වේ. දුම්රියෙන් අලින් ආරක්ෂා කිරීම සඳහා ආරක්ෂණ ක්‍රියාවලියක් ආරම්භ කිරීමට ද, අලින්ගෙන් වගාබිම් ආරක්ෂා කිරීම සඳහා ක්‍රමවේදයක් ද නූතන තාක්ෂණය ඔස්සේ හඳුන්වා දීමට සැලසුම් කරනු ලැබේ.

වඳුරන්, රිලවුන්, මොණරුන්, දඬුලේනන්, ඉත්තෑවන්, ඌරන් වැනි සතුන් නිසා ද රටේ ආර්ථිකයකට එකතු විය හැකි නිෂ්පාදන වලින් විශාල ප්‍රමාණයක් අහිමි වී යයි. එම සතුන්ගෙන් වගා ආරක්ෂාකර ගැනීම සඳහා ද ලෝකයේ දියුණු තාක්ෂණික ක්‍රම උපයෝගී කරගෙන කටයුතු කිරීමට බලාපොරොත්තු වේ.

## ඈ) සාගරය සහ ධීවර ආර්ථිකය

ශ්‍රී ලංකාව අවට ඇති මුහුද බොහෝ සම්පත් පිරුණු ආකරයක් වන නමුත් ඉන් අපි නෙළා ගන්නේ ඉතා අඩු ප්‍රතිලාභයන් ය. නිරන්තරයෙන් ම අපගේ මුහුද ආක්‍රමණය කර මත්ස්‍ය සම්පත සොරා ගැනීම සිදුවන අතර එය වළක්වා ගැනීම සඳහා රාජ්‍ය තාන්ත්‍රික වශයෙන් කටයුතු කොට නිසි ක්‍රමවේදයක් හඳුන්වා දීමට කටයුතු කරන අතර ඉදිරියේ දී එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තීන්ට අනුව අපගේ මුහුදු කලාපය දැන් පවත්නා ප්‍රමාණයට වඩා තුන් ගුණයක් පමණ විශාල වීමට නියමිතය. සාගරය පිළිබඳ ගවේශණ කටයුතු සහ පර්යේෂණ කටයුතු සිදු වන්නේ නැති තරම් වන අතර ඒ සඳහා නව වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුව ඇත.

සමුද්‍රීය ප්‍රදේශ සංරක්ෂණය, සමුද්‍රීය සම්පත් තිරසාරව භාවිත කිරීමෙන් ඇති ආර්ථික ප්‍රතිලාභ උපරිම කිරීම, සමුද්‍රීය ආරක්ෂාව සඳහා විද්‍යාත්මක දැනුම, තාක්ෂණය හා පර්යේෂණ භාවිතා කිරීම, කුඩා පරිමාන සාම්ප්‍රදායික ධීවර කර්මාන්තය දිරි ගැන්වීම, ජාත්‍යන්තර සමුද්‍රීය නීතිය බලාත්මක යනාදිය අපේක්ෂා



කෙරේ. රජය විසින් ආරම්භ කළ නීල හරිත ආර්ථිකය සහ තිරසර සංවර්ධන ඉලක්ක සඳහා වූ ව්‍යාපෘති යාවත්කාලීන කර පවත්වා ගෙන යාම අවශ්‍ය වේ. සමුද්‍ර භාවිතාය ලුණු හා මත්ස්‍ය සම්පත් ප්‍රමාණයක් නෙලා ගැනීමට සීමා වී ඇත. ශ්‍රී ලංකාවේ මත්ස්‍ය අස්වැන්නෙන් දල ජාතික නිෂ්පාදනයට ලැබෙන්නේ 2%-3% ක පමණ ප්‍රතිශතයකි. ඩොලර් ඉපදිය හැකි සමුද්‍රීය ආර්ථිකයේ හා නීල ආර්ථිකයේ ආයෝජන අවස්ථා නිර්මාණය වී නැත. සාගර පර්යේෂණ සඳහා සම්පත්වල සීමාවන් හඳුනා ගනිමින්, ශ්‍රී ලංකාව නාවික පර්යේෂණ ඒකකයක් පිහිටුවීම, ඉන්දියාව, ඉන්දුනීසියාව සහ ඕස්ට්‍රේලියාව වැනි රටවලින් තාක්ෂණික මග පෙන්වීම් ලබාගැනීම, නාවික හමුදා සාගර පර්යේෂණ ආරම්භ කිරීම, ජාතික ආරක්ෂාව වැඩි දියුණු කිරීම සහ ආර්ථික සමෘද්ධිය ඇති කිරීම අරමුණු කරයි. යෝජිත නාවික ඒකකය, තිරසාර සාගර කළමනාකරණය සඳහා වන ගෝලීය ප්‍රයත්නවල ක්‍රියාකාරී සහභාගිවන්නෙකු ලෙස ශ්‍රී ලංකාව ස්ථානගත කිරීමට අපේක්ෂිතය. සංචාරක කර්මාන්තය දියුණු කිරීමට ද සාගරය යොදා ගත හැකිවේ.

ශ්‍රී ලංකාවේ මුහුද හරහා යන නැව් සංඛ්‍යාව වාර්ෂිකව 40,000 කට ආසන්න වේ. එම නැව් වලින් අයකළ යුතුව ඇති රාජ්‍ය භාගය 1985 පටන් අපට අහිමි වී තිබුණේ ජලශාස්ත්‍රීය නීතියක් අප රට තුළ සම්පාදනය කර නොතිබීම නිසා ය. 2024 වසරේ එම පනත සම්මත කරගත් නිසා ඉදිරියේ දී විශාල ආධායමක් ලබාගත හැකිය. එම අඩුපාඩුව නිසා 2023 වසරේ පමණක් ශ්‍රී ලංකාවට අහිමි වූ ඍජු ආදායම ඇ.ඩො. මිලියන 51 (රුපියල් බිලියන 16) ක් ලෙස ගණන් බලා ඇත. ඉදිරියේ දී ජලශාස්ත්‍රීය මිනුම් සිදු කිරීමෙන් අනතුරුව එම ආධායම රටට ලබාගත හැකි වේ.

ධීවර කර්මාන්තය දියුණු කිරීම සඳහා ව්‍යවසායකත්වය සහ ප්‍රාග්ධනය පුළුල් කිරීමේ නව වැඩපිළිවෙළක් ආරම්භ කළ යුතු අතර ධීවර නිෂ්පාදන සඳහා පවතින වෙළඳපොළේ ඇති අවිධිමත්භාවය හේතුවෙන් ධීවරයන්ට සාධාරණ මිලක් ලබාගත නොහැකිව ඇත. එමෙන් ම පාරිභෝගිකයාට ද සාධාරණ මිලකට මත්ස්‍ය නිෂ්පාදන නොලැබෙන්නේ අතරමැදි ව්‍යාපාරික මාෆියාව නිසා ය. මෙම තත්ත්වය සමනය කොට ධීවරයාත් පාරිභෝගිකයාත් ආරක්ෂා කිරීම අපගේ අරමුණයි.

# කර්මාන්ත

අප රටේ දළ දේශීය නිෂ්පාදනයට කර්මාන්ත අංශයෙන් ලැබෙන දායකත්වය 32%ක් වන නමුත් අප රටේ පවතින සම්පත් සහ ශ්‍රම දායකත්වය තුළ ඊට වඩා වැඩි ප්‍රතිශතයකින් පවත්වා ගෙන යාමට ඉඩකඩ ඇත. එහෙත් වරින් වර කර්මාන්ත සම්බන්ධව අනුගමනය කරනු ලැබූ ප්‍රතිපත්ති සහ ක්‍රමවේද වල දුර්වලතා නිසා එය ඉතා පහළ මට්ටමක පැවතීමට හේතු විය. වසර 10 ක කාලයක් සඳහා සැලසුම් කර මෙම ප්‍රතිශතය වසරකට 1% බැගින් වැඩිකර ගැනීම මගින් වසර 10 ක් අවසානයේ 42% ක ඉලක්කයක් කරා යාමට සැලසුම් සකසනු ඇත.

රටේ ඉතා විශාල ජන කොටසකට රැකියා අවස්ථා ලබා දී ඇත්තේ කර්මාන්ත අංශයේ ව්‍යවසායකයින් ය. කෘෂිකර්ම අංශයේ නිෂ්පාදන වැඩි වන විට කර්මාන්ත අංශයේ නිෂ්පාදන ධාරිතාව වැඩිකර ගැනීම ඉතා පහසු ය. එහෙත් මෙරට පවතින රාජ්‍ය තන්ත්‍රයේ අකාර්යක්ෂමතාවය සහ නිලධාරිවාදය කර්මාන්ත අංශය දියුණු කිරීමට මහත් බාධාවක් වී ඇත. කර්මාන්තයක් ආරම්භ කිරීම සහ පවත්වා ගෙන යාම සඳහා අවසරපත් ලබා ගැනීම වසර ගණනක් ගතවන දීර්ඝ ක්‍රියාවලියක් වන අතර කර්මාන්ත ශාලාවලට අවශ්‍ය මාර්ග, ජලය, විදුලිය වැනි අවශ්‍යතා සපුරා ගැනීම ද දිගු කලක් ගතවන වෙහෙසකර ක්‍රියාවකි. එම ගැටලු අවම කිරීම සඳහා ආයෝජන මණ්ඩලය පිහිටවනු ලැබූයේ වුව ද, එහි අරමුණු සාක්ෂාත් කර ගැනීමට නොහැකිව ඇත. එම නිසා කර්මාන්ත සම්බන්ධව පවතින නීති රාමුව මුළුමනින් ම වෙනස් කළ යුතුව ඇති අතර දින කිහිපයකින් සියලු බලපත්‍ර සහ නිශ්කාෂණ සිදුකර ගැනීමේ ක්‍රියාවලියක් සකසන අතර කර්මාන්ත ක්ෂේත්‍රයේ සේවකයින්ගේ සහ ව්‍යවසායකයින්ගේ අයිතිවාසිකම් තුලනාත්මක ලෙස පවත්වා ගෙන යාමට අවශ්‍ය නීති රාමුව සකසනු ලැබේ.

ව්‍යවසායකයින් සඳහා විශේෂිත වූ බැංකු පද්ධතියක් ස්ථාපිත කිරීම ද, පහසු ක්‍රමවේද මගින් ණය පහසුකම් ලබා දීම ද, අසීරු අවස්ථාවන්හි දී ප්‍රතිව්‍යුහගත කිරීමේ සරල ක්‍රමවේදයක් හඳුන්වා දීම ද, මූල්‍ය ආයතන වල ගසා කෑමට ලක් වීම වළක්වා ගැනීම පිණිස ද පියවර ගනු ලැබේ. එමෙන් ම කෘෂිකර්මාන්තයේ භාණ්ඩ අපනයනය මගින් ඉහළ ආදායමක් ලබා ගැනීම පිණිස අගය වැඩි කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීමට නියමිත ය.

# මූල්‍ය ප්‍රතිපත්ති

## අ) බැංකු ප්‍රතිපත්ති

ශ්‍රී ලංකාව බංකොළොත් භාවයට ඇද වැටීමට බලපෑ මූලික කාරණයක් වූයේ මූල්‍ය පාලනයේ පවතින දෝෂසහගතභාවය මෙන් ම සමහර අංශ සම්බන්ධයෙන් රජයට මූල්‍ය පාලනය සඳහා ඇති බලය ගිලිහී යාම ය. මුදල් අමාත්‍යංශය යටතේ පවතින භාණ්ඩාගාරයත්, ශ්‍රී ලංකා මහ බැංකුවත් යන ආයතන දෙක ම දැඩි දේශපාලන ග්‍රහණයකට නතුව අවස්ථාවාදීන්ගේ දේශපාලන අරමුණු ඉටුකිරීමට ගොස් රට ම බංකොළොත් භාවයට තල්ලු කොට ඇත. බොහෝ අවස්ථාවල භාණ්ඩාගාරයේ වගකීම මහ බැංකුව විසින් ද, මහ බැංකුවේ වගකීම් භාණ්ඩාගාරය විසින් ද ඉටුකිරීමට යාම තුළ නිර්මාණය වූ ගැටුම් අවසන් වූයේ සමස්ත ආර්ථිකය ම විනාශයට ඇද දමමිනි.

ශ්‍රී ලංකා මහ බැංකුව ස්වාධීන කිරීම සඳහා අලුතින් සම්මත කළ පණතේ බොහෝ සාධනීය ලක්ෂණ පැවතියේ වුව ද එහි ඇති මූලධර්ම තේරුම්ගෙන නිවැරදි තීන්දු තීරණ ගැනීමට ඒ තුළ ක්‍රමවේදයක් තිබේ ද යන්න ප්‍රශ්න සහගත ය. පසුගිය සමයේ අදූරදර්ශී ලෙස සිදුකරන ලද මුදල් නෝට්ටු මුද්‍රණය වැනි දේ නතර කිරීම ප්‍රගතිශීලී ලක්ෂණයක් වන නමුත් තවත් බොහෝ ප්‍රතිසංස්කරණ වල අවශ්‍යතාව ඇත.

මහ බැංකුවේ වගකීම් අතර එය රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති සම්පාදක මෙන් ම මූල්‍යආයතන පාලකයා ලෙස ද කටයුතු කළ යුතුව ඇත. මූල්‍ය ක්ෂේත්‍රය තුළ බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතන පවතින අතර රක්ෂණ ක්ෂේත්‍රය ද ඊට ඍජු ලෙස සම්බන්ධතාවක් දක්වයි. බැංකු මූල්‍ය ආයතනවල ප්‍රමිතිය ආරක්ෂා කිරීම සහ පොලී අනුපාත තීරණය කිරීම මහ බැංකුවේ වගකීමක් වන අතර පසුගිය කාලය පුරාවට ම මහ බැංකුව වාණිජ බැංකුවල තිරසාර භාවය පිළිබඳ දැඩි උනන්දුවක් දක්වමින් කටයුතු කළත්, ගනුදෙනුකරුවන් පිළිබඳ දක්වන ලද්දේ අදූරදර්ශී ප්‍රතිපත්තියකි.

කෝවිඩ්-19 සමයේ පටන් රටේ කඩා වැටුණු ආර්ථිකය තුළ ව්‍යවසායකයන් සිය ව්‍යාපාර පවත්වා ගෙන ගියේ දැඩි බාධක මැද ය. එහෙත් බැංකු කිසිදු අනුකම්පාවකින් තොරව ෂයිලොක් ගණයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම නිසා බොහෝ ව්‍යවසායකයින්ගේ ව්‍යාපාර ඇද වැටුණි. පරාටේ නීතිය ක්‍රියාත්මක කිරීම මගින් ව්‍යාපාරිකයන් විශාල සංඛ්‍යාවක් මුළුමනින් ම අකර්මණ්‍ය කොට ඇත. ඊට අදාළ නීති සංශෝධන කරනු ලබන අතර බැංකු සහ ගනුදෙනුකරුවන් යන දෙකොට්ඨාසයේ ම තිරසාර බව තුලනාත්මක ලෙස පවත්වා ගෙන යාමට අවශ්‍යප්‍රතිපත්ති හඳුන්වා දෙනු ලැබේ.

ඉහත තත්ත්වය තුළ බැංකු ඉතා අධික ලාබ ලබමින් ඔවුන්ගේ ශේෂ පත්‍ර ශක්තිමත් කර ගැනීම තාවකාලිකව ලැබෙන වාසියකි. ව්‍යවසායකයින්ගේ සහ ව්‍යාපාරිකයන්ගේ ආර්ථිකය දුර්වල වූ විට බැංකු පද්ධතියට ද පැවැත්මක් නැති බව අවබෝධ කර ගැනීමට මහ බැංකුවට සහ බැංකු පද්ධතියට හැකියාව තිබුණේ ද යන්න ප්‍රශ්න සහගත ය.

## ආ) විදේශවිනිමය පාලනය

අපනයනය පිණිස කෘෂිකාර්මික සහ කාර්මික භාණ්ඩ ප්‍රමිතියකින් යුතුව නිෂ්පාදනය සඳහා දිරිගැන්වීම් කිරීමට කටයුතු යොදනු ඇත. මූල්‍ය ප්‍රතිපත්ති නවීකරණය කළ යුතු අතර විදේශ විනිමය නීතිය නිසි පරිද්දෙන් ක්‍රියාත්මක කළයුතු වේ. 2005 වසරේ පටන් අපගේ නිර්යාත මත රටට ප්‍රේෂණය කළ යුතුව තිබූ විශාල විදේශ විනිමය ප්‍රමාණයක් වංචනික ලෙස වෙනත් රටවල ආයෝජනය කිරීම සහ රඳවා තබා ගැනීම නිසා ශ්‍රී ලංකාව බරපතළ විදේශ විනිමය අර්බුදයක පැටලුනි. Global Integrity වාර්තා වල සඳහන් පරිදි අප රටට ප්‍රේෂණය කළ යුතුව තිබූ ඩොලර් බිලියන 57 ක් වත් අවම වශයෙන් එලෙස ප්‍රේෂණය නොකිරීම නිසා රට අර්බුදයට ලක්ව ඇති බව සඳහන් වේ. 2017 වසරේ විනිමය පාලන පනත අවලංගු කොට විනිමය පනතක් සම්මත කිරීම මගින් බොහෝ කාරණා සම්බන්ධව මහ බැංකුවේ පාලනය ඉන් ඉවත් වී ඇත. එම දුර්වල නීතිය ද මෙම තත්ත්වය උග්‍ර කිරීමට බලපා ඇත. විදේශ විනිමය පාලනය සඳහා දැඩි ප්‍රතිපත්තියක් ඇතුළත් නව නීතියක් සම්මත කර ගැනීමට කටයුතු කරගනු ලබන අතර විනිමය වංචාකරුවන්ට දැඩි දඬුවම් ලබා දීමේ ක්‍රමයක් ද ක්‍රියාත්මක කළ යුතු වේ.

## ඇ) රාජ්‍යබැංකු පද්ධතිය

බ්‍රිතාන්‍ය පාලන සමයේ ලංකා බැංකුව ආරම්භ කළේ ද, සිරිමාවෝ අග්‍රාමාත්‍යතුමිය මහජන බැංකුව ආරම්භ කරනු ලැබුවේ ද, මේ රටේ කෘෂිකර්ම සහ කර්මාන්ත සඳහා ආයෝජන අවස්ථා ලබා දීමටත්, ව්‍යවසායකයින් නිර්මාණය කිරීමටත් ය. 1977 දක්වා එම බැංකු දෙක එම වගකීම ඉටුකරමින් සිටියේ වුව ද, විවෘත ආර්ථිකයත් සමඟ රාජ්‍ය බැංකු පෞද්ගලික බැංකු සමඟ තරඟයේ දිවීමට කටයුතු කරමින් බැංකු පිහිටුවීමේ අරමුණ පවා අමතක කරන ලදී. 1977 ට පෙර සියලු කෘෂි සේවා මධ්‍යස්ථානවල පැවති බැංකු මගින් ගමේ ආර්ථිකය ශක්තිමත් කළ අතර 300 කට අධික එම බැංකු ශාඛා පද්ධතිය වසා දැමීම නිසා ගැමි ගොවියාට සහ කර්මාන්තකරුවාට ගිනිපොලී කරුවන්ගෙන් ණය ලබා ගැනීමට සිදුවිය. එම නිසා එම ක්ෂේත්‍ර මුලුමනින්ම බිඳ වැටුණි. රාජ්‍ය බැංකු ද ඔවුන්ගේ ශේෂ පත්‍රය පුළුල් කිරීමට උත්සාහ දැරුවේ රටේ ශේෂ පත්‍රය හැකිළෙන බව අවබෝධ කර ගැනීමට නොහැකි වීම නිසා විය හැකිය. කර්මාන්තකරුවන් වෙනුවෙන් ආරම්භ කළ එක ම බැංකුව වන ජාතික සංවර්ධන බැංකුව ද පුද්ගලික අංශයට විකුණා දමන ලදී.

අද වන විට ලංකා බැංකුව සහ මහජන බැංකුව ලබා දී ඇති ණය අතරින් රුපියල් බිලියන 620 කට වැඩි ප්‍රමාණයක් අක්‍රීය ණය ගණයට වර්ගීකරණය කොට ඇති අතර ඉන් වැඩි කොටසක් බොල් ණය ලෙස කපා හැරීමට නියමිත බව පැහැදිලිය. එසේ බොල් ණය ලෙස කපා හැරීමට නියමිත මුදල මෙරට ව්‍යවසායකයින්ට ප්‍රාග්ධන ආයෝජන සඳහා ලබා දී තිබුණා නම් අද පවතින අර්බුදය ඇති නොවීමට ඉඩ තිබුණි. එසේ බොල් ණය ලෙස කපා හැරීමට නියමිත ණය මුදල් ලබා දී ඇත්තේ කිසිදු හෝ ප්‍රමාණවත් සුරැකුමක් හෝ නොමැතිව වන අතර ඒවා දූෂිත දේශපාලනඥයින්ගේ මැදිහත් වීම මත ලබා දෙන ලද ණය මුදල් ය.

## ඈ) කෘෂිකර්මාන්තය සහ කර්මාන්ත සඳහා නව බැංකු පද්ධතියක්

කෘෂිකර්මාන්තය, කර්මාන්ත, කුඩා කර්මාන්ත, ධීවර කර්මාන්ත සහ අපනයන ප්‍රවර්ධනය පිණිස නව බැංකු පද්ධති දෙකක් ආරම්භ කිරීම යෝග්‍ය වන අතර අඩු පොලී අනුපාතයක් යටතේ ණය ලබා දීම ද, ණය ගෙවීමේ පහසු ක්‍රමවේද අනුගමනය කිරීමට ද මෙමගින් බලාපොරොත්තු වේ. එමෙන් ම නිෂ්පාදන සඳහා වෙළඳපොළ ආර්ථිකයන් සොයා ගැනීමට පහසුකම් සැලසීමට ද මෙමගින් බලාපොරොත්තු වේ.

## ඇ) කොටස් වෙළඳපොළ

මෙරට කොටස් වෙළඳපොළ ඉතාමත් ම දියුණු මට්ටමකට පැමිණියේ වුව ද පසුගිය කාලයේ පැවති ආර්ථික පසුබෑම නිසා එය ද දුර්වල තත්ත්වයට පත්ව ඇත. අනෙක් අතට කොටස් වෙළඳපොළ අයුතු ලෙස යොදා ගනිමින් සිදුකළ වංචනික ගනුදෙනු සහ ක්‍රියාකාරකම් නිසා ජනතාවට ඒ පිළිබඳ විශ්වාසය බිඳ වැටී ඇත. එහෙයින් කොටස් වෙළඳපොළ හරහා ආයෝජන අවස්ථා වැඩිකර ගැනීමට ව්‍යවසායකයින්ට තිබූ අවස්ථාව බොහෝ සෙයින් මඟහැරී ගොස් ඇත. කොටස් වෙළඳපොළේ සිටින ව්‍යාපාරිකයන් අභ්‍යන්තර රහස් වංචනිකව යොදාගනිමින් කොටස් වෙළඳපොළේ ගනුදෙනුකරුවන් අසරණ තත්ත්වයට පත්කරමින් ගෙනගිය ක්‍රියාකලාපය මුළුමනින් ම නවතා පාරදෘෂ්‍යභාවයකින් යුතුව කටයුතු කළ හැකි කොටස් වෙළඳපොළක් ප්‍රතිනිර්මාණය කිරීම කාලීන අවශ්‍යතාවකි.

## ඉ) ක්ෂුද්‍ර මූල්‍ය ආයතන සඳහා වෙනම අධිකාරියක්

ක්ෂුද්‍ර මූල්‍ය ආයතන පාලන බලතල ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පැවරී ඇතත් නිසි ලෙස එය කරගෙන යාමට ශ්‍රී ලංකා මහ බැංකුවට ධාරිතාවක් නොමැත. රට පුරා ක්‍රියාත්මක වන ක්ෂුද්‍ර මූල්‍ය ආයතන පැහැදිලි අධීක්ෂණයකට යටත් නොවන අතර මේ වන විට ඉතා අධික පොලී අනුපාත වලට ණය ලබා දෙමින් සහ ගනුදෙනුකරුවන්ගේ නිශ්චල සහ චංචල දේපළ ඔවුන් නමට හරවා ගනිමින් බරපතළ ගණයේ අක්‍රමිකතා රට පුරා ක්‍රියාත්මක කරයි. එම නිසා ක්ෂුද්‍ර මූල්‍ය ආයතන අධීක්ෂණයට සහ පාලනයට ගැළපෙන නීති ප්‍රතිපත්තියක් හඳුන්වා දෙන අතර එම ආයතන අධීක්ෂණය පිණිස නෛතික බලය එම අධිකාරිය වෙත පැවරේ.

රටතුළ ක්‍රියාත්මක වූ මූල්‍ය පද්ධතියේ අදූරදර්ශිභාවය නිසා ඇති වූ අහිතකර ප්‍රතිඵලය ලෙස බොහෝ ජනතාව මුදල් පොළීකරුවන්ගේ ග්‍රහණයට හසු වී හමාරය. කිසිදු පාර්දෘෂීභාවයකින් තොරව කරන ගණුදෙණු හේතුවෙන් ණය ගැනුම්කරුවන් දැඩි ලෙස පීඩාවට පත් වී ඇති අතර ණය, උකස්, කල්බදු ගිවිසුම් වැනි දෑ කිසිදු සාධාරණ පදනමකින් තොරව සිදු කෙරේ. එම නිසා එම තත්ත්වයන් පාලනය කිරීම සඳහා හා අධීක්ෂණය කිරීම සඳහා නව නීති රාමුවක් යටතේ බලයලත් අධිකාරියක් පිහිටුවනු ලැබේ.

# රාජ්‍ය බදු ප්‍රතිපත්තිය

පසුගිය දශක ගණනාවක් තිස්සේ අපේ රටේ ක්‍රියාත්මක වූයේ කිසිදු න්‍යායකට නොගැළපෙන නිරන්තරයෙන් වෙනස්කම් වලට භාජනය වන අක්‍රමවත් බදු ක්‍රමයකි. එම බදු ක්‍රමය ඉතා ව්‍යාකූල එකක් හෙයින් රජයට මෙන් ම බදු ගෙවන්නන්ට ද විශාල පරිපාලනමය වියදමක් දැරීමට ද සිදුව ඇත. එමෙන් ම කිසිදු පූර්ව දැනුම් දීමකින් තොරව නිතරම බදු ප්‍රතිපත්ති වෙනස් වීම නිසා ව්‍යවසායකයින්ට ඔවුන්ගේ ව්‍යාපාර පවත්වා ගෙන යාම මහත් අභියෝගයක් වී ඇත. යම් ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ දී පැවති බදු ප්‍රමාණය අතරමග දී වැඩි කරනු ලැබුවහොත් එම ව්‍යාපාර මුළුමනින් ම බිඳ වැටේ. එම නිසා බදු පරිමාණයන් ක්‍රියාත්මක කිරීමට පෙර අවම වශයෙන් වසර 5 ක කාලයකට පෙර ප්‍රකාශයට පත්කළ යුතු අතර අවම වශයෙන් වසර 10 ක කාලය තුළ ක්‍රියාත්මක කරනු ලබන දිගු කාලීන බදු ප්‍රතිපත්තිය කල් ඇතුව ප්‍රකාශයට පත් කිරීමට බලාපොරොත්තු වේ.

වර්තමානයේ පවතින ආධායම් බද්ද, අගය එකතු කළ බද්ද ඇතුලු අනෙකුත් බදු ක්‍රම ඉතා සංකීර්ණ වන අතර බදු ගෙවන්නන්ගේ පසුපස ම හඹා යන ආදායම් බදු දෙපාර්තමේන්තුව බදු ගෙවිය යුතු එහෙත් මඟහැර සිටින තැනැත්තන් සම්බන්ධව නීතිය ක්‍රියාවේ යෙදවීමක් දක්නට නැත. මෙය බරපතළ ගැටලුවක් වන අතර බදු ගෙවන තැනැත්තන් ද අධෛර්යයට පත් කරයි. ජනතාවට ඔරොත්තු නොදෙන ලෙස අයබදු වැඩි කරන විට ඔවුන් නිතැතින් ම නිසි බදු ප්‍රමාණ ගෙවීම මඟහැරීමට කටයුතු කරයි. සාධාරණ බදු ප්‍රතිපත්තියක් සහ ප්‍රතිශතයක් ක්‍රියාත්මක කළහොත් ජනතාව බදු ගෙවීමට අකමැත්තක් නොදක්වනු ඇත.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ඇතිකරගත් එකඟතා මත බදු අයකිරීම ඉහළ දැමූ අතර අපගේ රටේ බොහෝ වෘත්තිකයන් රට හැර යාමේ ප්‍රවණතාවක් එමගින් ඇතිව තිබේ. එම නිසා ජාත්‍යන්තර මූල්‍ය ආයතන සමඟ සාකච්ඡා කොට බදු අය කිරීමේ සීමාව ඉහළ මට්ටමකට ගෙන යා යුතුය.

දැනට වැඩි කොටසක් වක්‍ර බදු මගින් ලබා ගැනීම නිසා ආර්ථිකයේ වැඩි බරක් දිළිඳු පන්තිය වෙත පැටවීම වළක්වා ගනු පිණිස ඍජු බදු ප්‍රමාණය වැඩිකර ගැනීමට කටයුතු කළ යුතු ය. රටේ දිළිඳු සහ මධ්‍යම පන්තියේ තැනැත්තන්ට අනවශ්‍ය බදු බර පැටවීම ඉවත් කළ යුතු වේ.

පැහැර හැර ඇති බදු සහ විදේශවල සඟවා ඇති මුදල් අයකර ගැනීමේ පිළිවෙළක් ක්‍රියාත්මක කරනු ලැබේ. බදු ගෙවීමට උනන්දු කිරීම සඳහා ක්‍රියාවලියක් සහ එම බදු නිසි පරිදි යෙදවෙන බවට සහතිකයක් ලබා දෙන වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරනු ලැබේ.

රාජ්‍ය බදු ප්‍රතිපත්තියක මූලික ලක්ෂණවන සාධාරණ බව, කාර්යක්ෂමතාව, සමානත්මතාව, නම්‍යශීලී සහ විනිවිදභාවයකින් යුතු රාජ්‍ය බදු ප්‍රතිපත්තියක් සහතික කිරීම අපගේ ප්‍රධාන පරමාර්ථයයි. මෙහි දී "ඍජු බදු හා වක්‍ර බදු නිසි ලෙස කළමනාකරණ කරමින් රාජ්‍ය බදු ආදායම රටේ සමස්ත සංවර්ධනයට,

ආදායම් බෙදී යාමේ විෂමතාව අවම වන පරිදිත්,"රාජ්‍ය බදු ආදායම බෙදී යා යුතු ය" යන මූලික පරමාර්ථය සඳහා රාජ්‍ය බදු ආදායම විනිවිදභාවයකින් යුක්තව සැලසුම් කළ යුතුව ඇත. එසේ ම, රටේ ව්‍යාපාරිකයන්, ව්‍යවසායකයින්, වෘත්තිකයන් සහ සේවා නියුක්තිකයන්ගෙන් දායක වන බදු මුදල් කිසිසේත් වංචාවෙන් හෝ දූෂණයෙන් අපහරණයට පත් නොවන බවට නීති රීති සම්පාදනය කිරීම තුළින් රාජ්‍ය ආදායම නිසි ලෙස ආරක්ෂා කිරීමට වගකීමක් හා වගවීමක් ඇති රාජ්‍යයක් බිහි කිරීම අපගේ මූලික අධිෂ්ඨානයයි.

මේ සඳහා අප විසින් මූලිකත්වය දෙනු ලබන ප්‍රධාන සාධකය නම්, ආදායම් බදු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී සමානාත්මතාව රැකෙන පරිදි රටේ ආර්ථික යන්ත්‍රණය ඩිජිටල්කරණය (digitalization) සඳහා පියවරෙන් පියවර යොමු කිරීමයි. එහි දී මූලික වශයෙන් පළමු පියවර ලෙස, ආදායම් බදු දෙපාර්තමේන්තුව, රේගු දෙපාර්තමේන්තුව හා සුරාබදු දෙපාර්තමේන්තුව එක ම ජාලයකට යොමුකරනු ඇත. ඩිජිටල්කරණය තුළින් බදු දැල (tax net) ශක්තිමත්කර ගැනීමටත්, ඒ හරහා රාජ්‍ය අපේක්ෂිත ආදායම ළඟාකර ගැනීමට ප්‍රමුඛස්ථානය ලබාදීමත් සිදු වේ. අපගේ මූලික ප්‍රතිපත්තිය වනුයේ ඍජු බදු සඳහා මහජනතාවට, ව්‍යාපාරිකයන්ට, ව්‍යවසායකයින්ට හා ආයෝජකයන්ට වර්ෂයෙන් වර්ෂයට වෙනස් නොවන ස්ථාවර ආදායම් බදු අනුපාතයක් දිගුකාලීනව පවත්වා ගැනීමත්, වක්‍ර බදු සඳහා (VAT/SSCL) අවම ආදායම් බදු අනුපාත පවත්වා ගැනීම තුළින් රටේ පොදු මහජනතාවට බලපාන රටේ සමස්ත උද්ධමනය අවම මට්ටමක පවත්වා ගැනීමත් ය. මේ සඳහා නිපුණතාවෙන් සහ ක්ෂේත්‍රයේ ප්‍රායෝගික දැනුමෙන් යුත් සාර්ථක වෘත්තිකයන් ප්‍රධානීන් ලෙස පත්කරනු ලබන අතර සෑම වර්ෂයක ම රාජ්‍ය අයවැය යෝජනා ඉදිරිපත් කිරීමට අදාළ ව ආදායම් බදු ප්‍රතිපත්තිය සම්පාදනය කිරීමට පෙර පූර්ව සමාලෝචනයක් ඉදිරිපත්කරනු ඇත.

මෙහි දී සාමාන්‍ය ජනතාවගේ දෛනික පරිභෝජනයට අත්‍යවශ්‍ය පරිභෝජන භාණ්ඩ සඳහා වන වක්‍ර බදු අවම මට්ටමක පවත්වා ගැනීම අපගේ ප්‍රධාන අරමුණක් වන අතර, සමස්ත බදු ආදායම උපයෝජනයකර බෙදා හැරීමේ දී, විනිවිදභාවය (transparency) සෑම අවස්ථාවක දී ම රටේ පොදු මහජනතාවට විවෘත කිරීමට වැඩසටහන් හා ක්‍රියා පිළිවෙත් නියාමනය ද සිදුකරනු ඇත.



# අපගේ ආදායම් බදු ප්‍රතිපත්තිවල ඉලක්ක

## ඍජු බදු (පුද්ගල සහ සංස්ථාපිත ආදායම් බදු)

- පුද්ගලයන් සඳහා වන ආදායම් බද්දට අයත් නොවන සීමාව (tax free allowance) වර්ෂයකට මිලියන 1.8 ක අවම මට්ටමක් පවත්වා ගෙන යාම.
- සේවා නියුක්තිකයන්ගේ ආදායම සඳහා අවම වශයෙන් අතිරේක ජීවන වියදම් දීමනාවක් ලෙස මාසිකව රු. 50,000 බැගින් වර්ෂයකට රු. 600,000 ක අතිරේක දීමනාවක් ලබා දීමට යෝජනා කිරීම.
- පුද්ගලයන් සඳහා දැනට පවතින උපරිම ආදායම් බදු අනුපාතය වන 36% ක බදු අනුපාතය, උපරිමය 24% මට්ටමක පවත්වාගෙන යාම.
- කෘෂිකර්මය, අධ්‍යාපනය, අපනයන යන විශේෂ ක්ෂේත්‍රවල දැනට පවතින 30% ක ආදායම් බදු අනුපාතය, උපරිමය 20% ක ආදායම් බදු අනුපාතයකට පවත්වා ගෙන යාම.
- රජයේ හඳුනාගත් ආර්ථික සංවර්ධන වැඩසටහන්වලට පුද්ගලික අංශයෙන් ලබා දෙන ආධාර (donations) සඳහා 100% ක වියදම් අඩු කිරීමේ දීමනාවක් (qualifying payments) ලබා දීම.
- සමාගම් සඳහා උපරිම ආදායම් බදු අනුපාතය 25% ක මට්ටමක පවත්වා ගෙන යාමට කටයුතු කිරීම.
- ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික කටයුතුවල නිරත වී සිටින ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් හා ව්‍යවසායකයන් හඳුනා ගැනීමට පූර්ව නිර්ණායක දේශීය ආදායම් බදු පනතින් හඳුනාගෙන ඔවුන් සඳහා විශේෂිත බදු සහන හඳුන්වා දීම තුළින් ඔවුන් දිරිගැන්වීමට කටයුතු කිරීම.
- දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව සහ ආදායම් බදු ගෙවන්නා අතර ධනාත්මක හා මිත්‍රශීලී පරිසරයක් ගොඩනැගීමට ක්‍රමවේද සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් ආදායම් බදු ගෙවන්නා, ආදායම් බදු ගෙවීමට දිරිමත් කිරීම හා බදු ගෙවන්නා හඳුනා ගැනීමට (tax payer recognition) ක්‍රියාත්මක වීම.

### වක්‍ර බදු (පුද්ගල සහ සංස්ථාපිත ආදායම් බදු)

- එකතු කළ අගය මත බදු අනුපාතය උපරිමය 15% ක මට්ටමක පවත්වා ගෙන යාම.
- සූර්ය පැනල (solar panel) ආශ්‍රිතව මූලික නිෂ්පාදන සහ උපාංග සඳහා ආනයනයේ දී සහනදායක VAT බදු අනුපාතයක් හඳුන්වා දීම.
- භාණ්ඩ මිලට ගෙන විකිණීම (buying and selling) කරනු ලබන ව්‍යාපාර සඳහා උපරිමය 5% ක VAT බදු අනුපාතයක් හඳුන්වා දීම හා ඒ සඳහා විශේෂිත බද්දට යටත් නොවන විකුණුම් සීමා (threshold) හඳුන්වා දීමේ ක්‍රම සොයා බැලීම.

# ව්‍යවසායකත්වය සහ රැකියා අවස්ථා

නව ව්‍යවසායකයන් ලක්ෂ 5 දක්වා ඉහළ දැමීමට අරමුණු කෙරේ. ඉදිරි වසර 5 සඳහා විශේෂ අවධානයක් යොමු කරනු ලබන අතර එමඟින් ප්‍රාග්ධන වෙළඳපොළ ප්‍රසාරණය කිරීම හා ඊට නව ප්‍රවේශයන් ලබා ගැනීම මූලික වේ. ලංකාවේ මෙතෙක් කාලයක් අවධානය යොමු වී නොතිබූ හිමිකම් කොටස ප්‍රාග්ධන වෙළඳපොල සඳහා විශේෂ අවධානයක් යොමු කිරීමට බලාපොරොත්තු වේ. ප්‍රාග්ධනය ගලා ඒමේ මූලික පියවරක් ලෙස පිළිගත් ගෝලීය ආයෝජකයන්ගේ වෙළඳපොල විශ්වාසය තහවුරු කිරීම සඳහා අවශ්‍ය නව නීති රීති හඳුන්වා දීම, පවතින නීති යාවත්කාලීන කිරීම හා වෙළඳපොල ප්‍රතිසංස්කරණයන් හඳුන්වා දීම සිදු කරණු ඇත.

ඊළඟ වසර 3 ඇතුළත අවම වශයෙන් ව්‍යවසායකයන් ලක්ෂ 5 ක් පමණ ජාතික ආර්ථික ප්‍රසාරණයට එකතු කිරීම සඳහා අවශ්‍ය මූලික වැඩපිළිවෙලක් ලෙස තාක්ෂණය හා පදනම් වූ කෘෂිකාර්මික, ධීවර සහ කාර්මික කෙෂ්ත්‍රයන් හි නව ව්‍යවසායකයන් බිහි කිරීමේ දීපව්‍යාප්ත වැඩපිළිවෙලක් පළමු මාස 6 ඇතුලත ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වෙමි.

තරුණ තරුණියන්ට රැකියා අවස්ථා නිර්මාණය වන පරිදි අධ්‍යාපන ක්‍රමය ප්‍රතිසංස්කරණ කිරීම ද, වෛද්‍ය, ඉංජිනේරු, පරිගණක වැනි ක්ෂේත්‍ර ප්‍රචලිත කිරීම ද, වෘත්තීය පුහුණුවීම් සඳහා අවස්ථා ලබා දීම ද අපගේ අධිෂ්ඨානය වේ. තරුණ‍තරුණියන් සඳහා ක්‍රීඩා පහසුකම් දියුණු කිරීම, කලා නිර්මාණ සඳහා යටිතල පහසුකම් සපයා දීම, විනෝදාස්වාදය සඳහා සහ මානසික සුවසහනය සඳහා උද්‍යාන, කලාගාර ඉදිකිරීම සඳහා උනන්දුවෙන් කටයුතු කරනු ඇත.

# බලශක්තිය

වර්තමානයේ සෑම රටක් ම මුහුණ දී ඇති බරපතළ ම අර්බුදය වන්නේ බලශක්ති අර්බුදයයි. එමෙන් ම බොහෝ රටවල් මේ වන විට සූර්ය බලශක්තිය කෙරෙහි වැඩි නැඹුරුවක් දක්වා ඇති අතර හැකිතාක් ෆොසිල ඉන්ධන භාවිතයෙන් ඈත් වෙමින් සිටිති. පුනර්ජනනීය බලශක්තිය උත්පාදනය කිරීම සඳහා සූර්ය පැනල ක්‍රමය ප්‍රචලිතව ඇති නමුත් ඒ සඳහා වැයවන ප්‍රාග්ධනය ඉහළමට්ටමක පැවතීම නිසා සහ ආනයන බදු නිසා ප්‍රායෝගික ගැටලු රාශියක් මතු වී ඇත. ශ්‍රී ලංකාවට නිරන්තරයෙන් හිරු එළිය ලැබීම ආශිර්වාදයක් වී ඇති අතර එමගින් එම ක්‍රමය මෙරට සාර්ථකව ප්‍රචලිත කිරීම සඳහා අවශ්‍ය බදු සහන ලබා දෙමින් දිරි ගන්වනු ලැබේ. ගෘහස්ථ සූර්ය බල පද්ධති ක්‍රමය ඉතා සාර්ථක ව්‍යාපෘතියක් බවට පත්කරගත හැකි අතර දැනට ඉන්ධන සඳහා දරන වියදම් බොහෝ සෙයින් ඉතිරිකර ගැනීමට එමගින් හැකියාව ලැබේ. පසුගිය කාල සීමාවේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කොන්දේසිවලට මුවා වී විදුලි බිල ඉතා ඉහළ ප්‍රමාණයකට වැඩි කිරීම නිසා බොහෝ කර්මාන්ත වැසී යන ලදී. මැතිවරණය ආසන්න වන විට දේශපාලන වාසි තකා විදුලි බිල ශීඝ්‍රයෙන් පහළ දැමීමට කටයුතු කිරීම මගින් ජනතාවට ප්‍රතිලාභ ලැබේ යැයි තර්ක කළත් මේ වන විටත් කර්මාන්ත බොහෝමයක් වැසී යාම නිසා එය රටේ ආර්ථිකයට එල්ල කළ මරු පහරක් බව පැහැදිලිව පෙනෙන්නට ඇත.

රටපුරා පවතින ගංගා දිය ඇළි භාවිත කරමින් කුඩා ප්‍රමාණයේ ජල විදුලි බලාගාර පද්ධති ආරම්භ කිරීම සඳහා බලශක්ති අර්බුදයට විසඳුම් ලබා දිය හැකි වේ. ධීවර කර්මාන්තය සඳහා ඉන්ධන සහන ලබා දීම අත්‍යවශ්‍ය වේ. පෙට්‍රල් සහ ඩීසල් ආනයනය වෙනුවට බොරතෙල් ආනයනය කර පිරිපහදු කිරීම මගින් ඒ සඳහා වැයවෙන වියදම අඩුකර ගැනීම පිණිස කටයුතු කරනු ලැබේ.

පුනර්ජනනීය බලය සහ විදුලි වාහන මගින් ප්‍රවාහන කටයුතු ද, ඛනිජ තෙල් සුරක්ෂිතතාව ඇති කිරීමේ වැඩපිළිවෙළක් ද ක්‍රියාත්මක කරනු ඇත.



# අධ්‍යාපනය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් රටේ සෑම පුරවැසියකුට ම අධ්‍යාපනය සඳහා සම අවස්ථාව ලබා දිය යුතු බව සහතික කොට ඇති නමුත් ප්‍රායෝගිකව එය සිදු නොවේ. 2023 වසරේ පාර්ලිමේන්තුව විසින් විශේෂ තේරීම් කාරක සභාවක් පත් කොට මෙරට අධ්‍යාපනයේ සිදුවිය යුතු ප්‍රතිසංස්කරණ පිළිබඳ නිර්දේශ ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදී. එම කමිටුවේ සභාපති ලෙස අධිකරණ අමාත්‍ය විජයදාස රාජපක්ෂ මහතා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ නිර්දේශ සහිත වාර්තාව කැබිනට් මණ්ඩලය විසින් අනුමත කර ඇති අතර වෙනත් දෑ අතර පහත සඳහන් ප්‍රතිසංස්කරණ නිර්දේශ කර ඇත.

- මුල් ළමාවිය අධ්‍යාපනය, අධ්‍යාපනයේ ප්‍රමුඛතම අංගය ලෙස සලකා වයස අවු. 6 අඩු සියලු දරුවන්ට මුල් ළමාවිය අධ්‍යාපනය සම ලෙස ලබා දීමට කටයුතු කළ යුතු ය. ඒ සඳහා අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් විශේෂිත වූ පුළුල් වැඩසටහනක් ක්‍රියාත්මක කළ යුතු අතර මුල් ළමා විය අධ්‍යාපනය සඳහා ගුරුවරු පුහුණු කිරීමට වෙනම ඒකකයක් පිහිටුවිය යුතුය.
- අ.පො.ස. සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ නිර්දේශිත පාඨමාලා සාධනීය ලෙස සංශෝධනය කළ යුතු අතර වර්තමානයට ගැළපෙන විෂයන් කෙරෙහි ප්‍රමුඛත්වය ලබා දිය යුතුය. ඒ අතර විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව, තාක්ෂණය, පරිගණක, කෘෂි විද්‍යාව යන විෂයයන් කෙරෙහි වැඩි නැඹුරුවක් දැක්විය යුතු ය.
- අ.පො.ස. උසස් පෙළ විභාගයට ඇතුලුවීමේ දී සහ උපාධි පාඨමාලාවන්ට ඇතුළු වීමේ දී සාමාන්‍ය පෙළ විභාගය සමත් විය යුතුය යන අනිවාර්ය කොට ඇති විෂය සීමාවන් සංශෝධනය සහ සිසු දරුවන්ගේ රුචිකත්වයට ප්‍රමුඛතාව ලබා දෙමින් විෂයන් තෝරා ගැනීමට අවස්ථාව ලබා දිය යුතු ය.
- අ.පො.ස. සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ පාඨමාලාවලට වෘත්තීය දැනුම ලබා දීමට කටයුතු කළ යුතු අතර දැනීම ප්‍රගුණ කරන අධ්‍යාපන ක්‍රමය වෙනුවට බුද්ධි වර්ධනය කෙරෙන අධ්‍යාපන ක්‍රමයක් හඳුන්වා දිය යුතු ය. ලකුණු ලබා දීමේ දී කටපාඩම් කිරීම මගින් විභාග වලින් ඉහළ ලකුණු ලබා ගැනීමේ ක්‍රමවේදය වෙනුවට අඩක් විභාග ක්‍රමයෙන් ද අනෙත් අඩ ඇගයීම් මත ද ලබා දෙන මිශ්‍ර ක්‍රමය අනුගමනය කළ යුතු ය.
- අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය 10 වසර අවසානයේ දී ද, උසස් පෙළ විභාගය 12 වසර අවසානයේ දී ද පැවැත්වීම මගින් දරුවන්ගේ කාලය ප්‍රයෝජනවත් ලෙස යොදා ගැනීම.

- උසස් අධ්‍යාපනය මුළුමනින් ම ප්‍රතිසංස්කරණය කළ යුතු අතර විශ්ව විද්‍යාල කොමිෂන් සභාව වෙනුවට උසස් අධ්‍යාපන කොමිෂන් සභාවක් ස්ථාපිත කිරීම. එහි අංශ තුනක් පැවතිය යුතු අතර දැනට විශ්ව විද්‍යාල කොමිෂම මගින් පාලනය වන රාජ්‍ය විශ්වවිද්‍යාල 16 ද, විවෘත විශ්වවිද්‍යාලය ද, වෙනත් ව්‍යවස්ථා මගින් පිහිටුවා ඇති විශ්වවිද්‍යාල 5 ද එකතුව විශ්වවිද්‍යාල 22 ක්වම අංශයෙන් පාලනය කළ යුතු වේ. දෙවෙනි අංශය මගින් දැනට අධ්‍යාපන අමාත්‍යංශයේ ලියාපදිංචි වී ඇති විශ්වවිද්‍යාල 26 සහ දැනට කිසිදු ආයතනයක ලියාපදිංචි වී නොමැති කිසිදු පාලනයකින් තොර විදේශීය විශ්වවිද්‍යාලවලට අනුබද්ධ ශාඛා ඇතුලු රට පුරා පවතින උසස් අධ්‍යාපන ආයතන 300 ක් පමණ අධීක්ෂණය කිරීම. දැනට ඒවා කිසිදු අධීක්ෂණයකට යටත් නොවේ. එම ආයතන සියල්ල රාජ්‍ය නොවන අංශය මගින් ඍජු ලෙස අධීක්ෂණය කිරීම මින් බලාපොරොත්තු වේ. ලියාපදිංචියෙන් තොරව කිසිදු උසස් අධ්‍යාපන ආයතනයක් පවත්වා ගෙන යා නොහැක. එහි 3 වන අංශය වන්නේ ප්‍රමිතිය සහ ප්‍රතීතනය තහවුරු කිරීමයි. ඒ අනුව ඕනෑම උසස් අධ්‍යාපන ආයතනයකින් දෙනු ලබන සහතිකයක් නිසි ප්‍රමිතියට අනුව අධ්‍යාපනය ලබා දීමෙන් පසුව නිකුත් කරන්නක් බව සහතික කළ යුතු ය. එසේ නොමැතිව අධ්‍යාපන ආයතන පවත්වා ගෙන යාම සාපරාධී වරදක් ලෙස දඬුවම් ලැබිය හැකි ය.

170,000 ක් පමණ සිසු දරුවන් අ.පො.ස. උසස් පෙළ සමත් වුවත්, රාජ්‍ය විශ්වවිද්‍යාලයට බඳවා ගන්නා ප්‍රමාණය 41,000 වැනි පහළ මට්ටමක පවතින හෙයින් ඉහළ අධ්‍යාපනයට රුචිකත්වයක් දක්වන දරුවන්ට සම අවස්ථාව ලබා දීම මෙමඟින් අදහස් කෙරේ. අනිත් අතට අධ්‍යාපන අවස්ථා මඳකම නිසා අපගේ දරුවන් දේශීය සහ විදේශීය වශයෙන් උසස් අධ්‍යාපන ආයතන වලට ඇතුළු වීමෙන් රටට අහිමි වන විදේශ විනිමය ප්‍රමාණය බිලියන ගණනක් වන අතර එය තක්සේරු කිරීමට පවා නොහැකිව ඇත.

වැඩිහිටි අධ්‍යාපනය සඳහා ප්‍රජා අධ්‍යාපන ක්‍රමයක් හඳුන්වා දීමට පියවර ගනු ලබන අතර දේශපාලනික සාක්ෂරතාව ඇතුළු අනෙකුත් විෂයයන් සම්බන්ධව ඔවුන් දැනුමෙන් සන්නද්ධ කිරීම අපගේ ඉලක්කය වේ.

විදුහල්පතිවරු, ගුරුවරු ඇතුලු අධ්‍යාපන සේවයේ සිටින බොහෝ දෙනෙකු අද මුහුණපා සිටින වැටුප් විෂමතා ද විශ්වවිද්‍යාල වල අනධ්‍යයන කාර්ය මණ්ඩලවල වැටුප් විෂමතා ද විසඳීම සඳහා සුදුසු පියවර ගැනීමට තීරණය කර ඇත.

ඩිජිටල් තාක්ෂණය පදනම් කරගත් අධ්‍යාපන ක්‍රමයකට විශේෂ අවධානයක් යොමුකරනු ලබන අතර තාක්ෂණය කේන්ද්‍ර කරගත් වෘත්තීන් පිළිබඳව ද වැඩි අවධානයක් යොමු වනු ඇත.



# සෞඛ්‍යය

මේ වන විට ශ්‍රී ලංකාවේ ජනතාවගේ සෞඛ්‍යය විශාල අවදානමකට ලක්ව ඇති අතර වෙළඳපොළ ආර්ථිකය විසින් ජනතාව නොමඟ යවමින් ජනතාවගේ සෞඛ්‍ය බරපතළ අවදානමකට ලක්කර ඇත. ආහාර සුරක්ෂිතතාව පිළිබඳ ප්‍රමාණවත් පාලනයක් නොමැතිකම නිසා බොහෝ ආහාර සෞඛ්‍යට අහිතකර තත්ත්වයට පත්ව ඇත. ගොවිතැනේ දී අස්වැන්න වැඩිකර ගැනීම සඳහා රසායනික පොහොර අවභාවිතය මෙන් ම එළවළු, පළතුරු සඳහා යොදන රසායනික පොහොර සහ ද්‍රව්‍ය නිසා රෝගීන්ගේ සංඛ්‍යාව එන්න එන්න ම වැඩි වන අතර පිළිකා වැනි රෝග බහුල ලෙස ව්‍යාප්ත වී ඇත. ආහාර රටාවන්හි පවතින අවිධිමත් සහ අසමානභාවය හේතුවන් බෝ නොවන රෝග බොහෝ සෙයින් වැඩි වී ඇත. ඊට ප්‍රධාන හේතුව ලෙස සැලකිය හැක්කේ ජනතාවට සෞඛ්‍ය අධ්‍යාපනය පිළිබඳ තිබෙන දැනීම පහළ මට්ටමක පැවතීමයි. සියලු මාධ්‍යය හරහා සෞඛ්‍ය අධ්‍යයනය ප්‍රචලිත කිරීම මගින් බොහෝ අවදානම් අඩුකර ගැනීමට අපට හැකිවනු ඇත.

තරුණ මහළු භේදයකින් තොරව කායික අභ්‍යාස සහ ක්‍රීඩා කිරීමේ වටිනාකම තේරුම්කරමින් ඒ සඳහා ජනතාව පෙළඹවීමට ප්‍රමුඛතාවක් දෙනු ඇත. භාවනා, යෝගී භාවනා වැනි මනස සන්සුන් කරන අධ්‍යාත්මික දියුණුවක් ඇතිකරමින් විනයානුකූළ සමාජයක් නිර්මාණය කිරීමට එමගින් හැකිවනු ඇත. පොදුවේ ජනතාවට ප්‍රතිලාභ ලබාගත හැකි සෞඛ්‍ය රක්ෂණ ප්‍රතිපත්තියක් සහ අත්හදා බැලීම් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන අතර එමගින් ලැබෙන අත්දැකීම් සමඟ ස්ථාවර රක්ෂණ ක්‍රමයකට අවතීර්ණ වීමට බලාපොරොත්තු වේ.

වර්තමානයේ ඖෂධ සහ වෛද්‍ය උපකරණ විශාල හිඟයක් පවතින අතර අඩුපාඩුවකින් තොරව සෞඛ්‍ය සේවාව පවත්වාගෙන යාම සඳහා රාජ්‍ය සුබසාධන මූලධර්ම මත පිහිටා සෞඛ්‍ය සේවය ප්‍රශස්ත මට්ටමකට ගෙන යාමට සැලසුම් කරනු ඇත.

විශේෂයෙන් ම දේශීය වෛද්‍ය ක්‍රම විද්‍යාත්මක මට්ටමෙන් ප්‍රවර්ධනය සහ පර්යේෂණ සඳහා යොමු කිරීම කාලීන අවශ්‍යතාවකි. ආයුර්වේද වෛද්‍ය විද්‍යාව සහ සම්ප්‍රදායානුකූලව පවත්වා ගෙන එන පාරම්පරික වෛද්‍ය ක්‍රම දේශීයව සහ ජාත්‍යන්තර වශයෙන් ජනප්‍රිය කිරීම මෙන් ම ව්‍යාප්ත කිරීම සඳහා පියවර ගැනීම මගින් ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය ඉහළ මට්ටමකට ගෙන ඒමටත්, එමගින් විදේශ මුදල් ආකර්ෂණය කර ගැනීමටත් බලාපොරොත්තු වේ. එම ක්ෂේත්‍රවල නියැලී සිටින වෛද්‍යවරුන් මෙන් ම විකල්ප වෛද්‍ය විද්‍යාවන්හි නිරතව සිටින වෛද්‍යවරුන් සම්බන්ධව පවතින නීතිමය බාධා පිළිබඳ සොයා බලා නිර්දේශ ඉදිරිපත් කිරීම එම ක්ෂේත්‍ර සම්බන්ධයෙන් පරිණතභාවයක් ඇති තැනැත්තන් ද ඇතුළත්වන කොමිසමක් පත් කිරීමට ද, එමගින් ලබා දෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීම ද බලාපොරොත්තු වේ.

# ජාතික සම්පත් සුරැකීම

ශ්‍රී ලංකාවේ පවතින සියලුම සම්පත් වර්තමාන පරපුරේ අපට අයත් නැත. අනාගතයේ උපදින පරම්පරාව වෙනුවෙන් එකී සම්පත්වල භාරකරුවන් ලෙස ඒවා ආරක්ෂා කිරීමේ වගකීම පමණක් අප වෙත පැවරී ඇත. ජාතික සම්පත් විදේශිකයන්ට විකිණීම හෝ පැවරීම හේතුකොටගෙන අප රට හා දේශපාලනය තුළ අසීරු අභියෝගවලට මුහුණ දෙමින් සිටී. කොළඹ වරායේ දකුණු ජැටිය, හම්බන්තොට වරාය සහ ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි වැනි දෑ විදේශ රටවලට පැවරීම හරහා අපට ජාත්‍යන්තරයෙන් එල්ලවන අභියෝග ඉහළ යමින් පවතින අතර ජාතික ආරක්ෂාව පිළිබඳව ද බරපතළ ගැටලු මතු වේ. 2001/03 ආණ්ඩු සමයේ එවකට විශාල වශයෙන් ලාභ ලබමින් පැවති ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව, ඇපලෝ රෝහල, ලංකා මැරයින් සර්විස් සමාගම ඇතුළු ආයතන සහ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විකුණා දමන ලදී. විජයදාස රාජපක්ෂ මහතා ලං.ග.ම විකිණීමේ ගනුදෙනුව ශ්‍රේෂ්ඨාධිකරණයේ දී අභියෝගයට ලක් කිරීම නිසා එම ගනුදෙනුව අහෝසි කරන ලදී. තවද ඔහුගේ කෝප් වාර්තා පදනම් කරගෙන ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දුන් නඩු තීන්දු දෙකක් මගින් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව, ඇපලෝ රෝහල, වරාය ඉඩම් වැනි දෑ නැවතත් ජනතාව අතට පත් කිරීමට හැකි විය.

වර්තමානයේ ද ජාතික සම්පත් එකින් එක විකුණා දැමීමට පිඹුරුපත් සකසා ඇති නමුත් ඒවාට ඉඩ දෙනු නොලබන අතර දේශීය වශයෙන් පවතින අසාර්ථක ව්‍යාපාර පමණක් දේශීය ව්‍යාපාරිකයන්ට සුදුසු ක්‍රමවේදයක් ඔස්සේ ප්‍රතිසංවිධාන කොට පවත්වා ගෙන යාම පිණිස ක්‍රමවේදයක් හඳුන්වා දෙනු ලැබේ.

# පරිසර සංරක්ෂණය

ශ්‍රී ලංකාවට ආශිර්වාදයක් ලෙස ලැබී ඇති පරිසර පද්ධතිය ජෛව විවිධත්වයෙන් ඉතා පොහොසත් ය. ලොව අන් කිසි රටක දැකගත නොහැකි විවිධත්වයක් එහි ඇති අතර එය සංචාරකයින්ගේ චිත්තාකර්ෂණයට නිරන්තරයෙන් භාජනය වේ. සිංහරාජය, මධ්‍යම කඳුකරය, යාල සහ විල්පත්තු වැනි වනාන්තර ඉතා වටිනා සම්පත් වන අතර ඒවා නැරඹීමට පැමිණෙන විදේශිකයන්ගෙන් රටට විශාල ආදායමක් ලැබිය හැක. එම සම්පත් විකිණීමට පැවති රජයන් නොයෙක් වර උත්සාහ කළ අතර අධිකරණ තීන්දු මගින් ඒවා වළක්වා ගැනීමට මෙරට පුරවැසියන්ට හැකියාව ලැබුණි.

මධ්‍යම කඳුකරයේ සංවේදී ජල පෝෂක ප්‍රදේශ ආරක්ෂා කර ගැනීමට ප්‍රමුඛතාව දෙනු ලබන අතර ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂිත ප්‍රදේශ ලෙස වර්ග කොට ආරක්ෂා කිරීමට කටයුතු කරනු ලැබේ. එප්පාවල පොහොර නිධිය වරක් රජය විසින් විදේශිකයන්ට විකුණා දැමීමට උත්සාහ දරන ලදී. එවැනි ස්වභාවික සම්පත් දේශීය වශයෙන් නිෂ්පාදන කටයුතු කිරීම සඳහා යොදා ගැනීමට දිරිමත් කරනු ලබන අතර ඒවා විදේශවලට විකිණීම සිදු නොවනු ඇත.

මිනිසාගේ පැවැත්ම සඳහා පවතින පාරිසරික පද්ධති විනාශ කරමින් ෆොසිල ඉන්ධන භාවිත කිරීමෙන් වායුගෝලයේ උෂ්ණත්වය ඉහළ ගොස් තිබීම බරපතළ කාරණයකි. ඒ හරහා ඇතිවිය හැකි නියඟ, ගංවතුර, නායයාම්, සුනාමි, ලැව්ගිණි, වසංගත රෝග සහ සාගත වැනි අවදානම් තත්ත්ව අනාගතයේ නිරතුරුව ම ඉස්මතු වීමට ඉඩ ඇත. ජනතාවට ආහාර පමණක් නොව ජලය පවා හිඟ වන තත්ත්වයකට ගෝලීය උණුසුම් තත්ත්වය කුරිරු ලෙසින් වර්ධනය වෙමින් පවතී. ලෝකයේ දියුණු රටවල් සංවර්ධනයේ නාමයෙන් පරිසර පද්ධතිය විනාශ කරමින් යන ගමන නවතාලීමට මෙතෙක් පැහැදිලි නායකත්වයක් ඉස්මතු වී නොමැති හෙයින් මිහිතල සමුළුවේ යෝජනා ක්‍රියාත්මක කිරීම පිණිස නායකත්වයක් ගැනීමට අප රටට හැකියාවක් ඇත. රටක සංවර්ධනය දියත් කළ යුත්තේ තාවකාලික වාසි තකා නොව මානවයාගේ පැවැත්ම සඳහා පවතින මිහිතලය රැකෙන පරිදි ය. ලෝකයේ බොහෝ රටවල සිදුවන අධික කාබන්ඩයොක්සයිඩ් විමෝචනය ලෝකයේ පැවැත්මට විශාල බාධාවක් වී ඇත.

# ඉඩම් ප්‍රතිපත්තිය

ජාතික ඉඩම් ප්‍රතිපත්තියක් සැකසීම සඳහා ඉඩම් කොමිෂන් සභාවක් පත් කරනු ලබන අතර සියලුම ජන කොටස් නියෝජනය වන පරිදි එහි සාමාජිකයන්ගේ සංයුතිය සැකසේ. රටේ බොහෝ ප්‍රදේශවල ඉඩම් සංවර්ධනය වී ඇත්තේ කිසිදු ක්‍රමවේදයක් නොමැති අසංවිධිත ආකාරයකට ය. ඉඩම් ප්‍රතිපත්ති සැකසීම පහසු කාර්යයක් නොවනු ඇත. එහෙත් බොහෝ ප්‍රදේශ තෝරාගෙන කෘෂිකාර්මික, කාර්මික, නේවාසික සහ මිශ්‍ර ඉඩම් යනුවෙන් මිනිසුන්ගේ භාවිතයට ගනු ලබන ඉඩම් කලාප වශයෙන් වෙන්කර හඳුනා ගැනීමටත්, එම ඉඩම් තුළ සංවර්ධන කටයුතු නිශ්චිත ක්‍රමවේදයකට අනුව ලබාගත් අනුමැතියක් යටතේ පමණක් සිදුකළ යුතු ලෙසටත් ප්‍රතිපත්ති සැකසේ.

රජයේ ඉඩම් ජනතාවගේ ප්‍රයෝජනයට ලබා දීමේ දී ඒ ඒ දිස්ත්‍රික්කවල පවතින අවශ්‍යතා සලකා බලනු ලබන අතර කෘෂිකාර්මාන්තයට යොදාගත හැකි ඉඩම් වෙනත් කිසිදු කටයුත්තකට නොයොදන ලෙසට කටයුතු කිරීමත්, ඒ ඒ ප්‍රදේශවල සිටින ජන කොට්ඨාසවල සංයුතිය සැලකිල්ලට ගැනීමත් සිදු කරනු ලැබේ. ඉඩම් ප්‍රතිපත්තිය සහ පරිහරණය පිළිබඳ ස්ථාවර කොමිසමක් ස්ථාපනය කරනු ලැබේ. දැනට ජනතාව ගොවිතැන්

කරගෙන හෝ පදිංචිව සිටින ඉඩම් වනජීවී කලාපවලට ඇතුළු වී තිබීම නිසා මතුව ඇති ගැටලු ඒ පිළිබඳ අධ්‍යයනය කරනු ලබන විශේෂඥ කමිටුවක උපදේශනය යටතේ නිරාකරණය කිරීමට කටයුතු කරනු ලැබේ.

පුරාවිද්‍යා ස්ථානවල ආගමික පසුබිම් මත හටගෙන ඇති ගැටලු සියලු ආගම්වල ඉහළ ම නායක මණ්ඩලයකින් සමන්විත උපදේශක කමිටුවක් සමඟ සාකච්ඡා කොට විසඳීමට පියවර ගනු ඇත. ඉඩම් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ දී ගංගා, වැව්, ඇළදොළ ආදී ජල මාර්ග දූෂණය නොවන ආකාරයට සහ ඒවාට හානියක් නොවන ලෙසට සිදු කරනු ඇත.

# නිවාස

වර්තමානයේ නිවාස ඉදිකිරීම් පැහැදිලි ක්‍රමවේදයක් අනුව සිදු නොවන අතර ඒ ඒ ප්‍රදේශවලට වඩාත් යෝග්‍ය වන නිවාස සංවර්ධන ව්‍යාපෘතීන් හඳුන්වා දීමට පියවර ගනු ලබන ඇත. සෑම පවුලකට ම අවම ප්‍රමිතියකින් යුතු නිවසක ජීවත් වීමට ඇති අයිතිය තහවුරු කිරීමට සියලු උත්සාහ දරන අතර නිවාස ඉදිකිරීම සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ලාභදායක ලෙස සැපයීමට කටයුතු කරනු ලබන ලැබේ. පරිසර හිතකාමී ලෙස නිවාස ඉදිකරනු ලැබේ. නිවාස ඉදිකිරීම කුඩා ගම්මාන ආකෘතියක් අනුව සිදු කරනු ලබන අතර ඉඩම් හිඟය පවතින ජන ඝනත්වය වැඩි ප්‍රදේශවලට තට්ටු නිවාස වඩාත් යෝග්‍ය වේ. එවැනි ගම්මානයකට අවශ්‍ය යටිතල පහසුකම් ලෙස ක්‍රීඩාංගණයක්, විනෝදාස්වාදය සඳහා ස්ථානයක්, බැංකුවක්, වෙළඳසලක් වැනි දේ ස්ථාපනය කරනු ඇත.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව පූර්ණ ප්‍රතිව්‍යුහගත කිරීමකට යටත් කොට මධ්‍යම සහ අඩු ආදායම් ලාභීන් සඳහා නිවාස ඉදිකිරීම පිණිස ව්‍යාපෘති ආරම්භකරනු ලබන අතර එම බැංකුව උපයන සියලුම ලාභ ණය යෝජනා ක්‍රම වෙනුවෙන් ආයෝජනයකිරීමට බලාපොරොත්තු වේ.

දැහැමි රටක්, නිවහල් හෙටක් මෙන් ම හරිත දේශයක්, නවමු මානයක් වෙත මේ රට මෙහෙයවීමෙහි ලා ඔහු ප්‍රමුඛස්ථානය දෙනු ලබයි. භාරතයේ අශෝක අධිරාජයා විසින් ස්ථාපනය කරන ලද ටැම් ලිපියක සඳහන් වන "සවේ මුනිසා ප්‍රජා මම" පාලි පාඨයෙන් කියවෙන පරිදි රටක පාලකයා සිය රටවැසියන් දරුවන් සේ රැකබලාගත යුතුය යන උතුම් ආදර්ශ පාඨයට ගරු කරමින් එය යථාර්ථයක් කිරීමට ඔහු දරන උත්සාහයට ඔබගේ පූර්ණ ආශිර්වාදය ලැබෙනු ඇතැයි විශ්වාස කරමු.

භගවත් ගීතාව පවසන්නේ කුල ගෝත්‍ර වශයෙන් හෝ උසස් පහත් වශයෙන් හෝ වෙන් කොට නොසලකා සියල්ලන්ට සම දර්ශනයෙන් සේවය කිරීම හා මෛත්‍රිය කිරීම නායකයාගේ කාර්යය බවයි. උස් පහත් භේදයකින් තොරව නීතිය සමව ක්‍රියාත්මක කරන තෙක් රට වැටී ඇති ආගාධයෙන් ගොඩගත නොහැක. ප්‍රශස්ත දෙය නිරතුරුව සේවනය කිරීමත්, සදාචාර විරෝධී ක්‍රියාවන්ගෙන් ඈත්ව ජීවත්වීමත්, පැහැදිලි දර්ශනයකින් යුක්තව කටයුතු කිරීමත් විචක්ෂණශීලී නායකයාගේ ස්වභාවය විය යුතු බව මහාභාරත කාව්‍යය පවසයි!

පාලකයකුගේ ප්‍රමුඛ කර්තව්‍යය විය යුත්තේ ඔහු යටතේ සිටින සියලු පුරවැසියන්ට සර්ව සාධාරණය ඉටු කිරීම යන කුරාන් පාඨයද මෙහිදී සිහිපත් කරමු. බයිබලයේ සඳහන් වන ආකාරයට දේවරාජ්‍යයේ ජාතීහු තමුන්ගේ කඩුවලින් නගුල්ද, හෙල්ලවලින් දෑකැතිද සාදාගන්නෝය. ඔවුහු තවදුරටත් එකිනෙකාට විරුද්ධව අවි ඔසවන්නේවත් යුද්ධ කරන්නේවත් නැත!

මේ ලෝකය වෙනස් වෙනවා දැකීමට ඔබ කැමති නම් එම වෙනස කළ යුත්තේ අන් කවරකුවත් නොව ඔබමය. ඊට සූදානම් වන්න. රටක පාලකයා සිය රටවැසියන් දරුවන් සේ රැකබලාගත යුතුය යන උතුම් ආදර්ශ පාඨයට ගරු කරමින් එය යථාර්ථයක් කිරීමට අපි දරන උත්සාහයට ඔබගේ පූර්ණ ආශිර්වාදය ලැබෙන බව අපි විශ්වාස කරමු. දැහැමි රටක් - නිවහල් හෙටක් මෙන් ම හරිත දේශයක් - නවමු මානයක් වෙත මේ රට මෙහෙයවීමෙහි ලා අපගේ අපේක්ෂකයා හට ඔබ වෙනුවෙන් කාලය සහ ශ්‍රමය කැපකර දහඩිය වගුරන පියෙකු විය හැකිය.

අපගේ අපේක්ෂකයා මෙම ජනාධිපතිවරණයේ අපේක්ෂකයෙකු ලෙස ඉදිරිපත් වන්නේ ශ්‍රී ලංකා රාජ්‍යයේත්, ශ්‍රී ලාංකීය ජාතියේත් විජයග්‍රහණය උදෙසාමය.

**චිරං ජයතු**



# සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය

සංචාරක කර්මාන්තය පිළිබඳ ලෝකයේ කළ බොහෝ අධ්‍යයන වලින් පෙන්වා දී ඇත්තේ ශ්‍රී ලංකාව සංචාරකයින්ගේ චිත්තාකර්ශණය දිනාගත හැකි සොබාදහමේ දායාදයක් බව ය. වෙරළ ආශ්‍රිත සංචාරක කර්මාන්තය මෙන් ම රට අභ්‍යන්තරයේ පවතින ඓතිහාසික පුරාවිද්‍යා ස්ථාන සංචාරකයින්ගේ සිත් බැඳ ගැනීමට හැකියාව ඇති සම්පත් ය. එමෙන් ම ස්වභාවික පරිසරය වින්දනය කරන්නන්ට, සංචාරක ප්‍රදේශ ඕනෑ තරම් මේ රට තුළ පවතී. එමෙන් ම ආගමික සංචාරක කටයුතු ඉතා ඉහළ මට්ටමකින් පවත්වා ගෙන යාමට හැකියාවක් ඇත. බෞද්ධ, හින්දු, කතෝලික, ඉස්ලාම් යන සෑම ආගමකට ම අයත් ජනතාව තුළ දැඩි භක්තියක් සහ විශ්වාසයක් පවතින ස්ථාන රාශියක් මෙරට පවතී.

එමෙන් ම අපගේ ආයුර්වේද වෛද්‍ය ක්‍රමවේද පිළිබඳව ලොව තුළ ඇත්තේ ඉහළ පිළිගැනීමකි. එමගින් දේශීය වෛද්‍ය ක්‍රමවේද දියුණු කිරීමට පියවර ගත හැකිය. වසර 5 ක කාලය තුළ දී ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයන්ගේ සංඛ්‍යාව මිලියන 10 ක් දක්වා ක්‍රමානුකූලව වැඩිකර ගැනීමේ උපාය මාර්ගයක් හඳුන්වා දෙනු ලැබේ. සංචාරකයන්ට අවශ්‍ය හෝටල් සහ නවාතැන් පහසුකම් ධාරිතාව ඉතා අඩු මට්ටමක පවතින නිසා ඒ සඳහා වැඩි යටිතල පහසුකම් සැපයීම ද කළ යුතු ය. එමෙන් ම සංචාරකයන්ගේ ආරක්ෂාව ඉහළ මට්ටමකින් තහවුරු කළ යුතු අතර සංචාරකයන් ආකර්ෂණය කර ගැනීමට හැකි ආගන්තුක සත්කාර සහ චාරිත්‍ර වඩ වඩාත් ප්‍රගුණ කළ යුතු වේ. සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය සඳහා වෙනම මූල්‍ය ආයතනයක මෙන් ම ආපදා කළමනාකරණ අරමුදලක අවශ්‍යතාව ද අප හඳුනාගෙන ඇත.

# ප්‍රවාහනය

පොදු ප්‍රවාහනය කාර්යක්ෂම සහ විධිමත් කිරීම මූලික ඉලක්කයක් වන අතර දුම්රිය ප්‍රවාහන සේවය ශක්තිමත් කිරීම රටට වඩාත් වාසිදායක ක්‍රමය වනු ඇත. යාපනය සිට තංගල්ල දක්වා දුම්රිය මාර්ගය නවීකරණය තුළින් රටතුළ භාණ්ඩ ප්‍රවාහනය කරනු ලබන ප්‍රධාන මාධ්‍යය දුම්රිය බවට පත්කළ හැකිය. තව ද එමගින් ශීඝ්‍රගාමී දුම්රිය ගමන් කිරීමට හැකිවන පරිදි දුම්රිය මාර්ග ශක්තිමත් කිරීම ද අවශ්‍ය වේ. සෑම දුම්රිය ස්ථානයක ම රාජ්‍ය-පෞද්ගලික අංශ ඒකාබද්ධ යාන්ත්‍රණයක් තුළින් අවහන්හල් සහිත කුඩා නාගරික ඒකකයක් ස්ථාපනය කරනු ලබන අතර ජනතාවට අවශ්‍ය සනීපාරක්ෂක පහසුකම් ප්‍රමාණවත්ව ලබා දීමට කටයුතු කරනු ඇත. විවේකාගාර ආපන ශාලා යනාදිය ඇතුළත් එවැනි ස්ථාන ආශ්‍රිතව කුලී රථ සේවාවන් පවත්වා ගෙන යාමට පහසුකම් සපයනු ඇත. එමගින් පෞද්ගලික වාහන මගින් ගමනාගමනය හැකිතාක් අවම කිරීමට කටයුතු කෙරෙන අතර ඉන්ධන භාවිතය අඩු කිරීමෙන් විශාල ලෙස විදේශ විනිමය ඉතිරිකර ගත හැකි වේ.

# විදේශ ප්‍රතිපත්තිය

ශ්‍රී ලංකාවට අදටත් නොබැඳි විදේශ ප්‍රතිපත්තිය ගැලපෙන නමුත් පසුගිය ආණ්ඩු විවිධ හේතු මත සහ ඔවුන්ගේ අඥානභාවය නිසා බොහෝ රාජ්‍යයන් අමනාප කරගෙන ඇත. නොබැඳි මධ්‍යස්ථ ප්‍රතිපත්තියක සිටියේ නම් එවැනි මතභේද සහ අමනාපයන් නොමැතිව සියලු දෙනාගේ සහාය අප රටේ සංවර්ධනයට දායක කරගත හැකිව තිබුණි. නොබැඳි පිළිවෙත තුළ කලාපීය රටවල් සමඟ වඩාත් කිට්ටු වූ සම්බන්ධතා ගොඩනගමින් සියලු බලවේග රටේ ආරක්ෂාවට සහ අභිවෘද්ධියට උපකාරී කරගත හැකි ලෙස පවත්වා ගෙන යනු ලැබේ. කිසිදු රටක් ඈත්කර ගනිමින් අපට ප්‍රතිලාභයක් නොලැබෙන අතර ඕනෑම රටක් මිත්‍රශීලීව ඇසුරු කිරීම මගින් බොහෝ ජයග්‍රහණ ලබාගත හැකිය.

වර්තමානයේ තානාපති සේවයට යොදවාගනු ලබන්නේ බොහෝ සෙයින් රටේ ජනතාව විසින් ප්‍රතික්ෂේප කරනු ලැබූ දේශපාලන නෂ්ඨාවශේෂ හෝ දේශපාලනඥයන්ගේ ඥාතිකම් ඇති හැරම්ටියෙන් යන අවලංගු චරිත වේ. බොහෝ මැති ඇමතිවරුන්ගේ දූදරුවන් පෝෂණය කිරීම සඳහා තානාපති සේවය යොදාගෙන ඇති අතර ඔවුන් එම කාර්යාලවල පුරවා මහජන මුදල් කාබාසිනියා කරන තත්ත්වයකට පත්ව ඇත. විදේශ සේවාවේ තානාපතිධුර දැරීම සඳහා පෞරුෂයක් සහ නායකත්වයක් ඇති අය මෙන් ම රටට විශාල සේවාවක් සිදුකළ හැකි ඉහළ පිළිගැනීමක් ඇති වෘත්තිකයන් මෙම සේවාවට යොදවා ගැනීමට බලාපොරොත්තු වේ. විශේෂයෙන් ම රටවල් අතර පවතින ආර්ථික සබඳතා දියුණු කරගත හැකි නායකත්වයක් ඊට අවශ්‍ය වේ.

# ජනමාධ්‍ය

ප්‍රජාතන්ත්‍රවාදයේ පැවැත්ම සඳහා අවශ්‍ය ඔක්සිජන් සපයනු ලබන්නේ නිදහස් මාධ්‍ය ව්‍යාපාරයෙනි. මාධ්‍ය නිදහස මුළුමනින් ම ආරක්ෂා කරනු ලබන අතර මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව සැපයීම සඳහා අවශ්‍ය පියවර ගනු ලැබේ. එදා විජයදාස රාජපක්ෂ මහතා අධිකරණ ඇමති ලෙස තොරතුරු දැනගැනීමේ අයිතිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ මූලික අයිතිවාසිකමක් ලෙස නීතිගත කළ අතර තොරතුරු දැනගැනීමේ පනත මගින් පාරදෘශ්‍ය භාවය තහවුරු කිරීමට රජයේ ඕනෑම ආයතනයක අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට නීතිමය ප්‍රතිපාදන සකසා ඇත. රටේ සියලුම මාධ්‍ය ආයතන පැහැදිලි ජාතික ප්‍රතිපත්තියකට අනුගත කර ඔවුන් අතර අනවශ්‍ය ගැටීම් සහ තරඟකාරී බව ඉවත් කොට මිත්‍රශීලීත්වය වර්ධනය කිරීමත්, වඩාත් ජනතා හිතවාදී වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත්, ජනතාව සමඟ කිට්ටු සහසම්බන්ධතාවක් පවත්වා ගැනීමත් සඳහා අවශ්‍ය සියලු පියවර ගනු ලැබේ. එමෙන් ම මාධ්‍ය විසින් සිය වගකීම් ඉටුකිරීමේ දී පිළිගත් සම්මතයන්ට අනුව අනුගමනය කළ යුතු ප්‍රමිතීන්වලට සිදුකිරීම වඩාත් යෝග්‍ය වේ.

# වෙළඳපොළ ආර්ථිකය

තරඟකාරී වෙළඳපොළ ආර්ථිකය, ලිබරල් ආර්ථිකය ලෙස නිර්මාණය කළ බොහෝ රටවල් අද ලිහාගත නොහැකි ගැටලු රාශියකට මුහුණපා ඇත. එම රටවල ආර්ථිකය එන්න එන්න ම හැකිළෙමින් පවතින බව ඇමෙරිකා එක්සත් ජනපදය සහ යුරෝපය දෙස බැලීමේ දී මනා ලෙස පිළිබිඹු වනු ඇත. එකී ප්‍රශ්නවලට විසඳුම් සෙවීම සඳහා සාම්ප්‍රදායික ක්‍රමවේද අපට නොගැලපෙන අතර මතුවී ඇති ව්‍යාකූළ තත්ත්වයන් හේතුවෙන් එම රටවල ද බොහෝමයක් ජනතාව දුප්පත් බවේ රේඛාවෙන් පහළට ඇද වැටෙමින් සිටී. එක් පසෙකින් බල පොරයේ උච්ඡතම අවස්ථාවට පැමිණ මිහිතලය උණුසුම් කරවමින් සංවර්ධනයේ නාමයෙන් සොබාදහම විනාශ කරමින් පවතී. මුදල් ඒකකය සමාජයේ වැදගත්ම සහ තීරණාත්මක සාධකය වී ඇති ලිබරල් ආර්ථික ක්‍රමය තුළ සාධාරණයක් බලාපොරොත්තු විය නොහැක. වෙළඳපොළ ආර්ථිකයට නිදහසේ හැසිරීමට ඉඩක් තිබුණ ද එය සාධනීය මට්ටමක පවත්වාගෙන යාම සඳහා වෙළඳපොළේ නිදහස සහ ජනතාවගේ අයිතිවාසිකම් තුලනය කිරීමේ වැඩපිළිවෙළක් අත්‍යවශ්‍ය වේ. අත්‍යවශ්‍ය ආහාර භාණ්ඩ, ජලය, විදුලිය, ප්‍රවාහනය, අධ්‍යාපන, සෞඛ්‍ය වැනි ක්ෂේත්‍ර සම්බන්ධව වෙළඳපොළ ආර්ථිකයට හිතුමතේ කටයුතු කිරීමට ඉඩදිය නොහැක. එම සේවාවන් අධෛර්යමත් නොවන මට්ටමෙන් එම ක්ෂේත්‍ර අධීක්ෂණය සහ පාලනය රාජ්‍යයේ වගකීමක් සේ සලකා කටයුතු කිරීමට බැඳී ඇත.

# ජාතික ප්‍රතිපත්ති සඳහා උපදේශක සභාවක්

ජාතික ප්‍රතිපත්ති සම්පාදනය කිරීම, අනුමත කිරීම සහ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් රජයට උපදෙස් දීමට ජාතික ප්‍රතිපත්ති සභාවක් පිහිටුවනු ලබන අතර එය සියලු ජාතීන් සහ ආගමිකයන් නියෝජනය වන ඉතා ඉහළ මට්ටමේ විද්වතුන්ගෙන් සමන්විත සභාවක් වේ. ඔවුන් ගෞරවාන්විත සේවයක් ලෙස එම කරුණු අධ්‍යයනය කොට රජයට උපදෙස් දීමට කටයුතු කරනු ඇත.

ජාතික සමඟිය, ආර්ථික ප්‍රතිපත්ති, විදේශ ප්‍රතිපත්ති මෙන් ම ඉහළ වටිනාකමක් ඇති ගිවිසුම් අත්සන් කිරීම වැනි කාරණා සම්බන්ධයෙන් ද උපදෙස් දීමට එමගින් කටයුතු කරනු ඇත.

# විදෙස්ගත ශ්‍රී ලාංකිකයන්

විදේශගත ශ්‍රී ලාංකිකයන් අතර ප්‍රධාන කණ්ඩායම් දෙකක සිටිති. එක් කණ්ඩායමක් රැකියා සඳහා විදේශගතව සිටින අතර, අනිත් කණ්ඩායම විදේශ රටවල පදිංචිය හෝ පුරවැසිභාවය දරන ශ්‍රී ලාංකිකයන්ය. විදේශ රටවල රැකියා කරන ශ්‍රී ලාංකිකයන් විසින් උපයන විදේශ විනිමය රට තුළට ගෙන ඒමට උනන්දු කරවීම පිණිස දිරි දීමනා ලබා දීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීම යෝග්‍ය වේ. එමෙන් ම විදේශ රටවල පුරවැසිභාවය දරන ශ්‍රී ලාංකිකයන් සහ ඔවුන්ගෙන් පැවත එන්නන්ට ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය හෝ ද්විත්ව පුරවැසිභාවය ලබා දීමට සරල ක්‍රමයක් හඳුන්වා දෙමින් නීති ප්‍රතිසංස්කරණ කිරීමට බලාපොරොත්තු වේ. එමෙන් ම, විදේශගත ශ්‍රී ලාංකිකයන්ට ශ්‍රී ලංකාවේ ආයෝජන අවස්ථා පුළුල් කිරීමට සැලසුම් කරනු ලබන අතර ආයෝජන දිරිමත් කිරීම සඳහා සරල ක්‍රමවේද හඳුන්වා දීමට කටයුතු කරනු ලැබේ.

# අපගේ ඉලක්කය

බෞද්ධ ඉගැන්වීමෙහි එන දස රාජ ධර්ම හා ලිච්ඡවී රජ දරුවන්ගේ සප්ත අපරිහානීය ධර්ම ප්‍රතිපත්ති දේශපාලනිකව අපි විශ්වාශ කරමු. අප සැමගේ මාතෘභූමිය සුඛිත මුදිත කරනු පිණිස චක්‍රවර්තී සීහනාද සූත්‍රයේ සඳහන් පරිද්දෙන් ධර්මයෙහි පිහිටා, ධර්මයට සත්කාර කරමින්, ධර්මයට ගරු කරමින්, ධර්මය ප්‍රිය කරමින්, ධර්මය පුදමින්, ධර්මය වඳිමින්, ධර්මය ධජය කොට ගෙන, ධර්මය ලකුණකොට, ධර්මය අධිපති කරගෙන රාජ්‍ය කළ යුතුයැයි අපි විශ්වාස කරමු.

- කොළඹ විශ්ව විද්‍යාලයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය පිළිබඳ ආචාර්ය  උපාධිය (Ph.D)
- කැලණිය විශ්ව විද්‍යාලයේ බෞද්ධ දර්ශනය පිළිබඳ ආචාර්ය උපාධිය (Ph.D)
- පොදු රාජ්‍ය මණ්ඩලීය විශ්ව විද්‍යාලයේ නීතිය පිළිබඳ සම්මානනීය ආචාර්ය  උපාධිය (LL.D)
- කොළඹ විශ්ව විද්‍යාලයේ නීතිය පිළිබඳ දර්ශනපති උපාධිය (M.Phil)
- ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ බෞද්ධ දර්ශනය පිළිබඳ දර්ශනපති උපාධිය (M.Phil)
- කොළඹ විශ්ව විද්‍යාලයේ නීති උපාධිය (LL.B)
- ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ Attorney-at-Law
- ස්විට්සර්ලන්තයේ ෆ්‍රීබුර්ග් විශ්ව විද්‍යාලයෙන් ලබාගත් ගැටුම් නිරාකරණය පිළිබඳ ඩිප්ලෝමාව.

**විජයදාස රාජපක්ෂ**
**விஜயதாச ராஜபக்ஷ**
**WIJEYADASA RAJAPAKSHE**